# කාර්යසාධන වාර්තාව
# 2018

## වරාය හා නාවික කටයුතු සහ
## දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන: 011-2439352, 011-2435161
වෙබ්: www.portmin.gov.lk
Email: mpsasec@slpa.lk

## පෙරවදන

ඉදිරි දශකය තුල දී සියලු දෙනාටම ප්‍රතිලාභ හිමිවන ආර්ථික සංවර්ධනය හා මානව යහපැවැත්ම අරමුණු කරගත් තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, ඒ යටතේ ඇති වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව හා දක්ෂිණ සංවර්ධන අතුරු පාලක මණ්ඩලය යන ආයතන වලට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීමට සහාය ලබාදෙයි. එසේම එම ආයතන වල ඉලක්කගත සැලැසුම් ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය හරහා නිසි මගපෙන්වීමක් සිදුකරනු ලබයි.

ගෝලීය සැපයුම් දාමය හා ශ්‍රී ලංකාව සම්බන්ධ කරන වරාය හා නාවික ක්ෂේත්‍රය දේශීය ආර්ථික වර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයයි. ප්‍රධාන වාණිජ වරාය ලෙස කොළඹ වරාය කටයුතු කළද ගාල්ල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, ඔලුවිල් හා කන්කසන්තුරය යන වරායන්ද ගෝලීය සැපයුම් දාමයට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට 2018 වර්ෂය තුල බහාළුම් මිලියන 7ක් මෙහෙයුම් කරමින් වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කිරීමට හැකි විය. එය 2017 වසරට සාපේක්ෂව 13.5% වර්ධනයකි. මෙම ජයග්‍රහණයත් සමග ඇල්ෆාලයින් ශ්‍රේණිගත කිරීමට අනුව කොළඹ වරාය, ලෝකයේ බහාළු මෙහෙයවන වරායන් අතරින් ප්‍රමුඛතම වරාය බවට ඉතිහාසයේ ප්‍රථම වරට පත්ව ඇත. එමෙන්ම, ලෝකයේ බහාළුම් මෙහෙයුම් කරන ප්‍රධානතම වරායන් 30ක් අතරින් "සීග්‍රයෙන් දියුණු වෙමින් පවත්නා වරාය" ලෙසද 2018 වසර තුල කොළඹ වරාය ශ්‍රේණිගත කර ඇත.

නැගෙනහිර - බටහිර ජාත්‍යන්තර නාවික මාර්ගය ආසන්නව පිහිටි ශ්‍රී ලංකාව, මෙම මෙහෙයුම් ජයග්‍රහණයන් සමගම තරඟකාරීව හා උපායමාර්ගිකව ආසියානු කලාපයේ ප්‍රධානම නාවික භාණ්ඩ මෙහෙයුම් මධ්‍යස්ථානය බව පෙන්නුම් කර ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම උපාය මාර්ගික වටිනාකම් අවබෝධ කරගෙන ඇති අතර සියලුම වරායයන් ආවරණය වන පරිදි ජාතික වරාය ප්‍රධාන සැලැස්ම (National Port Master Plan) සකස් කිරීම ආසියනු සංවර්ධන බැංකුවේ (Asian Development Bank) සහය ඇතිව 2016 දී ආරම්භ කර ඇත. මේ වන විට ඒ යටතේ කොළඹ වරාය සංවර්ධන සැලැස්ම, කොළඹ වරාය මගී පර්යන්තය ඉදිකිරීම, ත්‍රිකුණාමලය සංවර්ධන සැලැස්ම හා ජාතික වරාය ප්‍රතිපත්තියට (National Port Policy) අදාළ කෙටුම්පත් කර අවසන් කර ඇත. වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය සංවර්ධනයට අදාළ අවසන් සැලැස්මේ තාක්ෂණ සමාලෝචන කෙටුම්පතද අවසන් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පවතින අධික මාර්ග තදබදය හමුවේ වරාය මෙහෙයුම් කාර්යක්ෂම සිදු කිරීමට ඉවහල් වනු ඇත.

නැව් භාණ්ඩ මෙහෙයුම්වලට අමතරව සමුද්‍ර සංචාරක කර්මාන්තය ඉලක්ක කරගත් පහසුකම් සංවර්ධනය සඳහා ආකෘතියක් සකස් කර ඇත. සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සලසා දීම ඇතුළු අදාළ අනෙකුත් සේවාවන් මෙහෙයවීම සඳහා කොළඹ වරායේ මගී පර්යන්තය සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා වී ඇත. සංචාරක හා ප්‍රවාහන ක්ෂේත්‍ර එක්ව කරනු ලබන මෙවැනි ඒකාබද්ධ ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකා ආර්ථිකය නඟාසිටුවීමට ඉහල දායකත්වයක් ලබාගත හැකිවේ.

ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ කේන්ද්‍රස්ථානය ලෙස වෙළඳ නාවික ලේකම් කාර්යාලය ක්‍රියාකරයි. සමුද්‍රික ක්ෂේත්‍රය තුල උසස් තත්ත්වයේ වෘත්තීය නැවියන් බිහිකිරීම තුලින් ඉහළ ආදායම් ලබන තරුණ පිරිසක් බිහිකර රටට විදේශ විනිමය උත්පාදනය කිරීම සහ නාවික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන

ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිති හා විධිවිධාන වලට අනුගතව ක්‍රියාත්මක වීම සහ නියාමනය උදෙසා වෙළඳ නාවික ලේකම් කාර්යාලය සුවිශේෂී කාර්යයක් ඉටුකරයි. වෙළඳ නාවික ලේකම් කාර්යාලය, 2018 වසර අවසන් වන විට සපයනු ලබන සේවාවන් මගින් රුපියල් මිලියන 101.04ක ආදායමක් උත්පාදනය කර ඇත.

වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ලංකා නැව් සංස්ථාව මගින් "සිලෝන් ප්‍රින්සස්" හා "සිලෝන් බ්‍රීස්" යන නෞකා දෙක භාවිතා කරමින්, විදුලි බල මණ්ඩලය යටතේ ඇති ලක් විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු අවශ්‍යතා හා වෙනත් රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතා අවම කාලයක් තුල අවම මිල ගණන් යටතේ උපරිම පාරිභෝගික විශ්වාසය තහවුරු කරමින් සිදු කරනු ලබයි.

එසේම නාවික පුහුණුව ලබා දෙන ආයතන වන, මොරටුව විශ්වවිද්‍යාලය, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය, කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විදුහල, වෙළඳ නැව් පුහුණු ආයතනය යන ආයතනයන්ගෙන් න්‍යායාත්මක පාඨමාලා අවසන් කරනු ලබන ආධුනික නාවිකයින් සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව මෙම නැව් හරහා ලබාදෙමින් තවදුරටත් ජාතික මෙහෙවරක වගකීමද ඉටු කරනු ලබයි.

දක්ෂිණ සංවර්ධන විෂය, 2018 වර්ෂයේ අවසාන භාගයේ මෙම අමාත්‍යාංශය වෙත පවරා දුන් අතර ඒ යටතේ දකුණු පළාතේ දිස්ත්‍රික්ක වලට අමතරව රත්නපුර, මොණරාගල සහ කලුතර යන දිස්ත්‍රික්ක තුනෙහිද සංවර්ධන ව්‍යාපෘති සිදුකරනු ලබයි. එමගින් එම දිස්ත්‍රික්කවල පවතින යටිතල පහසුකම් බෙදීයෑමේ විෂමතාව අඩුකර මහජනතාවට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ ලබාදීම තුලින් වඩාත් යහපත් ජීවන තත්වයක් ලගාකර ගැනීමට අවශ්‍ය පසුබිම සකස්කර ඇත. සංචාරක ආකර්ශනය දිනාගෙන ඇති දකුණු ප්‍රදේශයේ සංචාරක ආකර්ශනය තවදුරටත් වැඩිකිරීම සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද ප්‍රමුඛතාව ලබා දීමට අවශ්‍ය සැලසුම් කෙටුම්පත් කිරීමට යෝජනාවී ඇත.

වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2018 වර්ෂය සඳහා වන මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව 2002.09.12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 402 මගින් දෙන ලද උපදෙස් වලට අනුව පිළියෙල කර ඇත.

## I කොටස

අමාත්‍යාංශයේ පොදු තොරතුරු සහ සමස්ත මූල්‍ය කාර්යසාධනය ඉදිරිපත් කර ඇත.

## II කොටස

අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන වන

- වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- සීමාසහිත ලංකා නැව් සංස්ථාව
- දක්ෂිණ සංවර්ධන අතුරු පාලක මණ්ඩලය

2018 වර්ෂය තුල ළඟාකරගත් භෞතික හා මූල්‍ය කාර්යසාධනය ඉදිරිපත් කෙරේ.

## ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



ගෝලීය වශයෙන් පැවති අභියෝගාත්මක තත්ත්වයන් මැද වුවත්, ගෙවී ගිය 2018 වසර ශ්‍රී ලංකාවේ වරාය සහ නාවික ක්ෂේත්‍රයට ඉතා දීප්තිමත් වසරක් කරගන්නට ලැබීම අප රට ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් වූ බව මම විශ්වාස කරමි.

ඒ හරහා මෙරට ජාතික ආර්ථිකයට ලැබුණු දායකත්වය අතිමහත් වන අතරම ශ්‍රී ලංකාවේ නාමය ගෝලීය වරාය ක්ෂේත්‍රයේ ඉහළට ඔසවා තැබීමට ද එම ජයග්‍රහණ බෙහෙවින් ඉවහල් විය.

මෙයින් කැපී පෙනෙන ජයග්‍රහණයක් වූයේ ලෝකයේ ඉහළම බහලුම් වර්ධන වේගයක් සහිත වරායක් ලෙස කොළඹ වරාය අභිෂේක ලැබීමය. මෙලෙස ලෝක ශ්‍රේණිගත කිරීමක ශ්‍රී ලංකාව මුල්ම ස්ථානයට පත් වූයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වන අතර ඒ හරහා ගෝලීය වරාය සහ නාවික ක්ෂේත්‍රයේ අවධානය ශ්‍රී ලංකාව වෙත දිනා ගන්නට අපට හැකියාව ලැබිණි.

එසේම කොළඹ වරාය මිලියන 7ක බහලුම් ධාරිතාවක් හසුරුවා වරාය ඉතිහාසයේ නව සංධිස්ථානයක් පසුකළේ ද 2018 වර්ෂයේ ය. එය මෙරට වරාය සහ නාවික ක්ෂේත්‍රයට ආඩම්බර විය හැකි කාරණයක් වන අතර පසුගිය වසර තුළ මෙම ක්ෂේත්‍රය ලැබූ ප්‍රගතියේ සාක්ෂියක් ද විය.

එම ශක්තිමත් පදනම මෙම වසරේ අපගේ මූලිකම අභිප්‍රාය වන්නේ වරාය ධාරිතාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය තීරණ නොපමාව ලබා ගෙන පසුගිය වසර තුළ ලබා ගත් ප්‍රගතිය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීමයි. ඒ සඳහා වන මාවතට අප මේ වන විට අවතීර්ණ වී ඇති බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමි .

මේ යටතේ විශේෂයෙන්ම කොළඹ වරායෙහි ධාරිතාව වර්ධනය කරගැනීම සඳහා යටිතල පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් මේ වන විටත් පියවර රාශියක් ගෙන ඇත. එසේ යටිතල පහසුකම් සංවර්ධනය කරන අතරවාරයේම ජයබහලු පර්යන්තය පුළුල් කිරීම වැනි ව්‍යාපෘති තුළින් සීඝ්‍ර ප්‍රගතියක් අත් කරගැනීම අපගේ ඉලක්කගත අරමුණු අතර ප්‍රමුඛස්ථානයක ලා සැලකිය හැකිය.

වරාය ක්ෂේත්‍රය ඩිජිටල්කරණය මෙන්ම නවීන තාක්ෂණය වඩාත් ඵලදායීව මෙම ක්ෂේත්‍රය සඳහා යොදාගැනීම මෙම වසරේ අප විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් වන අතර ඒ යටතේ වරාය මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීමේ දැවැන්ත වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වේ. ඒ සඳහා රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වෙන් කොට ඇත. විශේෂයෙන්ම ලෝකය 'ස්මාට් පෝට්' වැනි සංකල්ප හරහා ඉදිරියට යන අතර අප ද රටක් වශයෙන් තරඟකාරීව මෙම ක්ෂේත්‍රයට මුහුණ දීමට නම් නවීන තාක්ෂණය වඩාත් ප්‍රශස්ථ අයුරින් මෙම ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

කොළඹ වරායෙහි ඵලදායීත්වය වැඩිකරන අතරම ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින වරායන් වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන සැලසුම්ද ක්‍රියාවට නැංවීම වැදගත්ය. අප රට සතුව පවතින වටිනාම ස්වාභාවික

සම්පතක් වූ ත්‍රිකුණාමල වරායේ රාත්‍රි මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා මේ වන විටත් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ගාලු වරාය සංචාරක වරායක් ලෙස දියුණු කිරීමට ද කටයුතු කෙරෙමින් පවති. විශාල ආයෝජනයක් සමග ඉන්දියාවේ ද සහය ඇතිව කන්කසන්තුරේ වරාය වාණිජ වරායක් ලෙස ස්ථාපිත කොට ඒ හරහා උතුරු සංවර්ධනය සවිබල ගැන්වීම ද අපගේ තවත් අරමුණකි.

එමෙන්ම අප අමාත්‍යාංශය යටතේ පවතින වෙළෙඳ නාවික ලේකම් කාර්‍යාලය නිසි වෘත්තීයමය භාවයෙන් යුතු නාවිකයන් මෙරටට දායාද කිරීමටත්, ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් නිසි පරිදි පවත්වා ගෙන යාමටත් විශේෂ මෙහෙයක් සිදු කරමින් සිටින අතර ශ්‍රී ලංකා නැව් සංස්ථාව මෙරට විදේශ විනිමය වර්ධනය කරගැනීම සඳහා සුවිශේෂී දායකත්වයක් සපයයි.

අප අමාත්‍යාංශය යටතේ පවතින දක්ෂිණ සංවර්ධන මණ්ඩලය මේ වන විට දකුණු ආර්ථික සංවර්ධන කලාපය ස්ථාපනය කිරීමේ කාර්‍යයෙහි නියැලී සිටින අතර ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක කලාපය වන දෙද්දුව සංචාරක කලාපය ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු ද මේ වන විට ශීඝ්‍රයෙන් සිදු කෙරෙමින් පවතී. එමෙන්ම දක්ෂිණ සංවර්ධන මණ්ඩලය විසින් පසුගිය වසරේ දියත් කරන ලද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් බිලියන 3කට අධිකය.

මේ අනුව ආයතනික ඉලක්ක මුදුන් පත් කර ගනිමින් මෙරට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යයට වරාය, නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැමිණෙන සියලු ආයතන මේ වන විට උරදෙමින් සිටී.

**සාගල රත්නායක (පා.ම.)**
**වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය**

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



දේශීය ආර්ථිකයේ කේන්ද්‍රස්ථානයක් බඳු දේශීය සංවර්ධන ප්‍රතිපත්තීන් ඒකරාශී කිරීමෙහි ප්‍රධාන අංශයක් සම්බන්ධ වන අමාත්‍යාංශයක් ලෙස වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පවතී. 2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන සහ අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ මගපෙන්වීම යටතේ වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය, ගරු සාගල රත්නායක මහතා සමඟ සම්බන්ධවී නියෝජ්‍ය අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීම භාග්‍යයක් ලෙස සලකමි.

වරාය හා නාවික ක්ෂේත්‍රය රටේ ආනයනය සහ අපනයනය කෙරෙහි ආර්ථික සංවර්ධනයෙහි බලපෑම් ඇති කරන ප්‍රධාන අංශයක් වේ. නව ආර්ථික ප්‍රතිපත්තීන් ශක්තිමත් කර රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් වරාය සංවර්ධනය කිරීම මගින් තවදුරටත් රටේ ජාතික ආදායමටත් අග්‍රාමාත්‍යතුමාගේ රැකියා දස ලක්ෂයක් ඇති කිරීමේ ව්‍යාපෘතියටද දායකත්වය සැපයිය හැකිවේ.

බටහිරෙන් කොළඹ, දකුණින් ගාල්ල සහ හම්බන්තොට උතුරෙන් කන්කසන්තුරේ, නැගෙනහිරෙන් ත්‍රිකුණාමලය සහ ඔලුවිල් යන වරායන් පිහිටා ඇති අතර ත්‍රිකුණාමලය ලෝකයේ ස්වභාවික වරායන් අතරින් දෙවෙනි ස්ථානය හිමිකරගෙන ඇත.

ත්‍රිකුණාමලය වරාය පාදක කරගනිමින් අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මහතාගේ සංකල්පය යටතේ 2020–2050 අවුරුදු 30ක දැවැන්ත සංවර්ධනය සැලැස්මක් සම්පාදනය කරනු ලැබ ඒ සඳහා වන සැලසුම් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

නැගෙනහිර ආසියාතික මාර්ගයෙහි පිහිටි ත්‍රිකුණාමලය වරායට විශේෂිතවූ ඉතිහාසයක් ඇත. 1796– 1972 වකවානුවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ ඔවුන්ගේ විවිධ ක්‍රියාකරකම් වලට මෙම වරාය උපයෝගී කරගෙන ඇත.

1972 වර්ෂයේ ත්‍රිකුණාමලය වරාය ශ්‍රී ලංකා රාජ්‍ය පාලනයට නතුවීමෙන් අනතුරුව ඛනිජතෙල්, පිටි, සිමෙන්ති යනාදිය ගොඩබෑම් සඳහා ජැටි කිහිපයක්ද 1997 වර්ෂයෙන් පසු අෂ්රෆ් ජැටියද නිර්මාණය වූ අතර, 2000 වර්ෂයෙන් අනතුරුව වරාය කේන්ද්‍ර කරගනිමින් වරායන් ආශ්‍රිත ප්‍රදේශ වල කර්මාන්තපුර බිහි වුවද එය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමක් සිදු නොවීය. මෙය සංවර්ධනය කිරීම තුළින් දිස්ත්‍රික්ක හා කලාපීය වශයෙන්ද දේශීය මට්ටමින්ද විරැකියා ප්‍රශ්නය විසඳීය හැකිවනවා මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයෙ වැඩි කිරීම තුළින් දේශීය ආදායම වර්ධනය කිරීමේ අවස්ථාවද උදාවේ.

ඔලුවිල් වරාය ගත්කල එහි වර්තමාන ක්‍රියාවන් අඩාල වී ඇති හේතුවෙන් ධීවරයන්ගේ සහ ප්‍රදේශවාසීන්ගේ ගැටළු නිරාකරණය කිරීමේ ප්‍රවණතාවයන් දක්නට ලැබෙන අතර අනාගතයේ ආරම්භ කරන සැලසුම් අනුව මෙම වරාය සංවර්ධනය කර ලාභ ඉපැයීමට හැකිවන පරිදි සැලසුම් දියත් කරමින් පවතී.

ඔලුවිල් වරාය සංවර්ධනය කිරීමෙන් එම ධීවරයන්ගේ ගැටළුවලට පූර්ණ විසඳුමක් ලබාදිය හැකිවේ. මෙහි 25000 කට වැඩි ධීවරයන් පිරිසක් මෙම වරාය පාවිච්චි කරන අතර මෙය සංවර්ධනය කිරීම තුළින් ඔවුන්ට යහපත් තත්ත්වයක් උදාවන බවද අපේක්ෂා කරනු ලැබේ.

නැගෙනහිර වරාය සංවර්ධනය කිරීම තුළින් නැගෙනහිර ආසියාතික රටවල් වල නැව් ගමනාගමනයේ වැඩිවීම හරහා වරායන් වලින් ලැබෙන ආදායම 50%කින් වැඩිකර දේශීය ආර්ථිකයට දායකත්වය ලබාගැනීමේ අවස්ථා උදාවනු ඇත.

තවද, එම රටවල ආනයනය හා අපනයනය තුළින් නැගෙනහිර ප්‍රදේශයේ රැකියා අවස්ථා සහ ආයෝජනයට සවිබල ගන්වා දේශීය ආදායම වැඩිකර රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් සපයන වැඩසටහනක් ඉදිරිපත් කරන්නෙමු.

උතුරු සහ නැගෙනහිර වරාය සංවර්ධනය හරහා ඒකමතික ප්‍රතිපත්තීන් මගින් රැකියා අවස්ථා සහ ආර්ථික සංවර්ධනය පෙන්නුම් කරන සාධනීය තත්ත්වයක් ඇතිකරලීමට අප ක්‍රියාකරන්නෙමු.

ත්‍රිකුණාමලය, ඔලුවිල් සහ කන්කසන්තුරේ වරායන් සංවර්ධනය කිරීම මාගේ වගකීම බව සිතමි. මක්නිසාදයත් නැගෙනහිර පළාත නියෝජනය කරන මා තුළ රටේ දේශීය ආර්ථිකයට ප්‍රධාන දායකත්වයක් මෙම වරායන් තුළින් ලබාදීමේ අධිෂ්ඨානයක් ඇති බැවිනි.

කොළඹ වරාය පසුගිය වසරේ ඉතිහාසයේ වැඩිම බහළු ප්‍රමාණයක් මෙහෙයවා ඇත. මෙය අනෙකුත් රටවල වරායන් සමඟ තරඟකර ලබාගත් විශාල ජයග්‍රහණයකි. මෙය තවදුරටත් පවත්වාගෙන යාමට නම් නව තාක්ෂණයෙන් වරායන් සන්නද්ධ කොට ශ්‍රී ලංකාව කෙරෙහි ලෝකයේ අවධානය ලබාගැනීමේ උපරිම උත්සාහය මාගේ සැම පාර්ශ්වකරුවන්ද සමඟින් ඉදිරියට යායුතු බව මෙම අවස්ථාවේ අවධාරණය කරන්නෙමු.

වරාය තුළින් රැකියා අවස්ථා ඇති කිරීම, නව වෙළඳ අවස්ථා උදා කිරීම, සංචාරකයන්ගේ පැමිණීම්, ජාත්‍යන්තර සම්බන්ධතා මගින් වරාය සංවර්ධනය කරාගෙන යාම අපගේ පරමාර්ථයයි.

තවද, විවිධ අභියෝගවලට මුහුණදෙමින් සහයෝගයෙන් හා අවබෝධයෙන් ක්‍රියාකරන ගරු වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මැතිතුමන්ටත්, ලේකම්, අද්මිරාල් එස්. එස්. රණසිංහ මහතාටත් වරාය අධිකාරියේ සභාපති කාවන් රත්නායක මහතාටත්, අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන්ටත් අධිකාරියේ සේවකයන්ටත්, අනෙකුත් වරාය හා සම්බන්ධ ආයතනවල නිලධාරීන්ටත් එහි සේවකයන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගැනීමට කැමැත්තෙමි.

**ගරු අබ්දුල්ලාහ් මහරූෆ් (පා.ම.)**
**වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය**

ලේකම්තුමාගේ පණිවුඩය



ආර්ථික හා දේශපාලනමය වශයෙන් දරණ උපායමාර්ගික ප්‍රවේශයන් ඵලදායීව මෙහෙයවමින් ශ්‍රී ලංකාවට දැවැන්ත විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම සඳහා අන්තර්ජාතික වෙළඳාම හා සම්බන්ධ දකුණු ආසියානු කලාපයේ නාවික කේන්ද්‍රස්ථානය බවට පත්කර ගැනීමට වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය ඒ යටතේ වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, හා සී/ස ලංකා නැව් සංස්ථාව යන ආයතනයන් මෙහෙයවමින් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ.

එම අරමුණ අනුව යමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ඔවුන් සතු ප්‍රමුඛ පර්යන්ත ත්‍රිත්වය වන ජය බහලු පර්යන්තය (JCT), දකුණු ආසියා ද්වාර පර්යන්තය (SAGT) සහ කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (CICT) මෙහෙයවා 2018 වසරේදී ජාත්‍යන්තර ඇගයීමට ලක්වූ ඉතිහාසගත වර්ධනයක් පෙන්නුම් කරමින් ග්ලෝබල් පෝර්ට් ෆෝරම් (GFP) සම්මානය දිනා ගැනීමට සමත්විය.

2018 වසර තුලදී කොළඹ වරාය වාර්තාගත බහාලු මිලියන 7ක් මෙහෙයවා ඇල්ෆාලයින් ශ්‍රේණිගත කිරීමට අනුව ලෝකයේ බහාළු මෙහෙයවන වරායන් අතරින් ප්‍රමුඛතම වරාය බවට ඉතිහාසයේ ප්‍රථම වරට පත්ව ඇත. එය 2017 වසරට සාපේක්ෂව 13.5% වර්ධනයකි. මෙම ජයග්‍රහණයත් සමගම ලෝකයේ බහලු මෙහෙයුම් කරන ප්‍රධානතම වරායන් 30 අතරින් “සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවත්නා වරාය” ලෙසද ඇගයීමට ලක්විය.

කොළඹ වරාය, ලොව විශිෂ්ඨතම පහසුකම් සපයන වරායන් 20 අතුරින් 13 වන ස්ථානයට පත්වීම අගය කල යුතුය. ඩෲරි සමුද්‍රීය සමීක්ෂණ (Drewry Maritime Research) වලට අනුව 2018 වසරේ තුන්වන කාර්තුවේ “ගෝලීය බහළු වරාය සම්බන්ධ කිරීමේ දර්ශකයට” (Global Container Port Connectivity Index) අනුව 2017 වසරට සාපේක්ෂව අගයන් 2ක ඉහල අගයක් වන 11 වන ස්ථානය ලබා ගැනීමට සමත්ව ඇත.

වෙළඳ නාවික ලේකම් කාර්යාලය, සියලු සාමුද්‍රික ක්‍රියාකාරකම්වල පරිපාලනමය හස්තය වශයෙන් ක්‍රියාකරයි. රැකියා අවස්ථා වැඩි කිරීම උදෙසා උසස් තත්වයේ වෘත්තීය නාවිකයින් බිහි කිරීම අරමුණු කර ගනිමින් කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ ආනයන අපනයන හා දේශීය වෙරළ ආශ්‍රිත ප්‍රවාහන කාර්යයෙහි, පහසුකම් සැපයීම සඳහා ස්ථාපිත කර ඇති ලංකා නැව් සංස්ථාව " සිලෝන් ප්‍රින්සස්” සහ “සිලෝන් බ්‍රීස් ”යන ස්වකීය නැව් දෙක මෙහෙයවමින් 2018 වසරේදී රුපියල් මිලියන 2,056ක ආදායමක් උපයා ඇත. තවද, ආධුනික නාවිකයන් 43 දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීමෙන් ප්‍රමුඛ ජාතික මෙහෙවරක් ඉටු කරයි.

2018 වර්ෂය අග භාගයේ දක්ෂිණ සංවර්ධන විෂය මෙම අමාත්‍යාංශය වෙත පවරා දුන් අතර ඒ යටතේ දකුණු පළාතේ දිස්ත්‍රික්ක වලට අමතරව රත්නපුර, මොණරාගල සහ කලුතර යන දිස්ත්‍රික්ක වලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සිදුකර මහජනතාවට වඩාත් යහපත් ජීවන තත්වයක් ලබා දීමට කටයුතු සලසා ඇත.

වරාය හා නාවික ක්ෂේත්‍රයේ පවතින ආයතනික අඩුපාඩු මගහරවා ගනිමින් සැලසුමකට අනුව සංවර්ධන කටයුතු මෙහෙයවීම තුලින් වර්තමානයේ පවතින තත්ත්වයට වඩා ඉහළ සාර්ථකත්වයක් පෙන්නුම් කල හැකි බව මාගේ විශ්වාසයයි.

මෙම අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන මෙහෙයවමින් නිසි මඟපෙන්වන හා උපදෙස් ලබා දෙන ගරු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය, සාගල රත්නායක මැතිතුමා සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය, මොහොමඩ් අබ්දුල්ලා මොහොමඩ් මහරූෆ් මැතිතුමා වෙත මාගේ ප්‍රණාමය පිරිනමන අතරම මේ සඳහා කැපවන කළමනාකාරිත්වය ඇතුළු සියලුම නිලධාරීන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**අද්මිරාල් එස්. එස්. රණසිංහ (විශ්‍රාමික)**
**ලේකම්, වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

# පටුන

පිටු අංකය

| | | |
|---|---|---|
| 01. | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය සහ දක්ෂිණ සංවර්ධන අතුරු පාලක මණ්ඩලය | 15 - 35 |
| 02. | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 37 - 46 |
| 03. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 47 - 71 |
| 04. | සී/ ස ලංකා නැව් සංස්ථාව | 73 - 84 |

# I කොටස

# වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය සහ දක්ෂිණ සංවර්ධන අතුරු පාලක මණ්ඩලය

## දැක්ම

"දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සාමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සාමුද්‍රීය සේවාවන් ලබාදීම"

## මෙහෙවර

"ජාතික ආර්ථික වර්ධනය සඳහා සාමුද්‍රික ප්‍රවාහන කටයුතු ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවික සේවාවන් සැළසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්‍ෂම යාන්ත්‍රණයක් සැකසීම"

## 1.1 කාර්යයන්

- අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සමායෝජනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන ආයතනවල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කරන නීතිමය රාමුවක් හඳුන්වා දීම.
- වරාය හා නාවික කටයුතු වලට අදාළ සේවාලාභීන්ට වඩාත් හොඳ සේවාවන් සැලසීම සඳහා නව මෙහෙයුම් නිර්ණායකයන් හඳුන්වාදීම.
- වරාය හා නාවික කටයුතු සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී යාන්ත්‍රණයක් විධිමත්ව සැකසීම.
- නැව් ඒජන්තවරුන්, බහළු මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්, නැව් බඩු ඉදිරිපත් කරන්නන්, යාත්‍රා හිමිකම් නොමැති පොදු ප්‍රවාහන සේවා සපයන්නන්, සංචාරක ඒජන්තවරුන් හා වෙනත් සේවා සපයන්නන් සඳහා වඩාත් ක්‍රියාශිලී හා ව්‍යාපාර හිතකාමී නියාමනයක් හා අධීක්ෂණයක් ඇති කිරීම.

## 1.2 ප්‍රධාන අංශයන්



## අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

ස්ථිර කාර්යමණ්ඩල තොරතුරු - 2018 දෙසැම්බර් 31 දිනට

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් සංග්‍රහය | අනුමත කාර්යමණ්ඩලය | පවතින කාර්යමණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| ලේකම් | - | - | එස්එල් 4 | 01 | 01 | - |
| අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | - |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී ලං ග සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 (වැ.බ.) | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 01 | 01 | 01 |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං සැ සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලං ඉ සේ | I | එස්එල් 1 | 01 | - | 01 |
| සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| ගණකාධිකාරී | ශ්‍රී ලං ග සේ | III/II | එස්එල් 1 | 01 | - | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 02 | 01 | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං සැ සේ | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | III/II | එස්එල් 1 | 01 | 01 | - |
| පරිපාලන නිළධාරී | රා ක ස සේ | අධි ශ්‍රේණිය | එම්එන් 7 | 01 | 01 (වැ.බ) | 01 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | I | එම්එන් 6 | 01 | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී. ලං. තො. හා ස. තා. සේවය | 2 පන්තිය II/I | එම්එන් 6 | 01 | - | 01 |
| සංවර්ධන නිළධාරී | සං නි සේ | III/II | එම්එන් 4 | 10 | 10 | - |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | කොන්ත්‍රාත් | - | රු. 36,620 /- + රු. 80/-මාසික | 01 | 01 | - |
| කළමනාකරණ සහකාර | රා ක ස සේ | III/II/I | එම්එන් 2 | 24 | 20 | 04 |
| රියදුරු | රියදුරු සේ | III/II/I/ විශේෂ | පීඑල් 3 | 13 | 08 | 05 |
| කා.කා.ස | කා.කා.සේ | III/II/I/ විශේෂ | පීඑල් 1 | 12 | 09 | 03 |
| වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | - | 14,425/- මාසික | 01 | - | 01 |
| නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | - | 14,425/- මාසික | 01 | 01 | - |


ගරු අමාත්‍යතුමා
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා
ලේකම්
අතිරේක ලේකම් (සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ.- විශේෂ
අතිරේක ලේකම් (පාලන හා මුදල්) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ
ප්‍රධාන මූල්‍ය නිලධාරී ශ්‍රී.ලං.ග.සේ. - විශේෂ
වෙළඳ නාවික ලේකම් කාර්යාලය
දක්ෂිණ සංවර්ධන අතුරු පාලක මණ්ඩලය
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ. I
අධ්‍යක්ෂ (සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ. I
අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.සැ.සේ. I
අධ්‍යක්ෂ (ඉංජිනේරු) ශ්‍රී.ලං.ඉ.සේ I
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. I
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ. I
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. III/II
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.සැ.සේ.III/II
සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. III/II
සහකාර ලේකම් (පාලන) ශ්‍රී.ලං.ප.සේ.
නීති නිලධාරී දෙපාර්තමේන්තු III
ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ. II
භාෂා පරිවර්තක භා. ප. සේ.
පරිපාලන නිලධාරී
සම්බන්ධීකරණ ලේකම්
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර.
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක

## 1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන අංශයන්ගෙන් සිදු කල ප්‍රධාන කාර්යයන්

### 1.3.1 ආයතන අංශය

#### 1.3.1.1 කාර්ය මණ්ඩල විස්තර

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක ලේකම් (පාලන හා මුදල්) | 1 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 |
| සහකාර ලේකම් | 1 |
| නීති නිලධාරී | 1 |
| පරිපාලන නිළධාරී | 1 (වැ. බ.) |
| භාෂා පරිවර්තක | 1 |
| තොරතුරු තාක්ෂණ | - |
| සංවර්ධන නිළධාරී | 2 |
| කළමනාකරණ සහකාර | 10 |
| කාර්යාල කාර්ය සහයක | 5 |
| රියදුරු | 8 |

#### 1.3.1.2. සිදු කළ ප්‍රධාන කාර්යයන්

i.) නීති හා අධිකරණ කටයුතු

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේදී පැන නැගුන නීතිමය ගැටළු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද නඩු 46ක් සම්බන්ධව එම දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

ii.) මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හා 2016.07.14 හා 01/2018 සහ 2018.02.15 දිනැති සහ 01/2018(1) සහ 2018.06.18 දිනැති ලිපි අනුව සහනදායි පදනම මත පහත පරිදි වාහන ආනයන බලපත්‍ර 72ක් නිකුත් කරන ලදී.

| ආයතනය | නිකුත් කල වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 10 |
| වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 01 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 52 |
| ලංකා නැව් සංස්ථාව | 09 |
| එකතුව | 72 |

iii.) වරාය ගාස්තු සහන ලබා ගැනීමට අදාළ ඉල්ලීම්

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලද ඉල්ලීම් 34ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිගෙන් විමසා ඇති අතර ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කර ඇත.

| ප්‍රගතිය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත කළ ඉල්ලීම් ගණන | 08 |
| අනුමත නොකළ ඉල්ලීම් ගණන | 09 |
| CICT/ SAGT/ Hambanthota Port මඟින් පාලනය වන බහලු බවට දන්වා ඇති ඉල්ලීම් | 06 |
| වාර්තා ලැබී නොමැති ඉල්ලීම් | 07 |
| ප්‍රේෂණලාභියාගෙන් අදාල ලිපි ලේඛන නොලැබීම නිසා වසා දැමීමට/ පසෙක තැබීමට තීරණය කල ඉල්ලීම් | 04 |

iv.) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ලියාපදිංචිය

අදාළ කාලය තුළ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා මාර්ගගත ක්‍රමවේදය අනුව නිළධාරීන් 12 දෙනෙකු ලියාපදිංචි කරන ලදී.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ නව ලියාපදිංචි කිරීම් 03ක් සහ නැවත ලියාපදිංචිකිරීම් 13ක් සිදුකරන ලදී. එමෙන්ම පෙර අමාත්‍ය කාර්යමණ්ඩලයේ සේවය කරන ලද නිළධාරීන් 05 දෙනෙකු සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර ඇත.

v.) විශ්‍රාමික කටයුතු

අමාත්‍යාංශයේ නිළධාරී හතරදෙනක් විශ්‍රාම ගිය අතර අන්තර්ජාලය භාවිතා කර ඔවුන්ගේ විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලදී. එමෙන්ම සේවයේ යෙදී සිටියදී මිය ගිය එක් මාණ්ඩලික නිලධාරියකු සඳහා මරණ පාරිතෝෂිකය, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සහ අනෙකුත් සියලු හිමිකම් පවුලේ සාමාජිකයින් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

vi.) වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අමාත්‍යාංශයේ විෂය පථය සම්බන්ධව විමසන ප්‍රශ්න සඳහා ගරු අමාත්‍යතුමා විසින් ලබාදෙන වාචික පිළිතුරු හා ඒ සම්බන්ධ පසුබිම් වාර්තා සැපයීම සිදු කරනු ලබයි. 2018 වර්ෂය තුළදී ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රශ්න 14 ක් විමසන ලද අතර ප්‍රශ්න 12 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

vii.) පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සම්බන්ධ කටයුතු

අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතනවල දැනට සේවයේ නියුතු සහ නියුක්තව සිටි නිලධාරීන්ගේ මෙන්ම අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන් හි පැමිණිලි සම්බන්ධ ක්‍රියාකිරීම සහ සහන සැලසීම මෙම කාරක සභාව මඟින් සිදු වේ. මෙම වසර තුළදී පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ලද එක් පැමිණිල්ලක් සඳහා ක්‍රියා කරමින් සිටි.

viii.) මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන පැමිණිලි, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට යොමුකර වාර්තා ගෙන්වා ගැනීම සහ අදාල වාර්තා සමඟ මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සිදු කරනු ලබයි.

මෙම කාලසීමාව තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයේ නියුතු සේවකයකු විසින් යොමු කරන ලද පැමිණිල්ලකට අදාළව කටයුතු අවසන් කර ඇත.

ix.) වීසා නිර්දේශ ලබාදීම

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාලව China Habour Engineering Company Ltd. ආයතනයේ නිලධාරීන් 13 දෙනෙකු සඳහා වීසා නිර්දේශය ලබාදී ඇත.

x.) “ජනපතිට කියන්න” වැඩසටහන

ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි, “ජනපතිට කියන්න” වෙබ් අඩවිය හරහා අමාත්‍යාංශය වෙත යොමු කළ පසුව, අමාත්‍යාංශය මගින් වෙබ් අඩවිය හරහා අමාත්‍යාංශය අනුබද්ධිත ආයතන වලින් අදාල ආයතනය වෙත එම ගැටළු යොමු කිරීම මෙහිදී සිදුකරනු ලබයි. ගැටලුව විසඳීමෙන් අනතුරුව ඒ පිළිබඳව වෙබ් අඩවිය හරහාම ජනාධිපති කාර්යාලය වෙත දැනුම් දීමට කටයුතු කරනු ලබයි.

අමාත්‍යාංශය වෙත මහජන පැමිණිලි 59ක් යොමුවී ඇති අතර එම සියලුම පැමිණිලි අදාළ ආයතන වලට යොමුකර ඇත. ඉන් පැමිණිලි 18ක් සම්බන්ධයෙන් කටයුතු සම්පූර්ණ කර වෙබ් අඩවිය යාවත්කාලින කර ඇත. පැමිණිලි 25ක් සම්බන්ධව කටයුතු කරමින් පවතී.

xi.) විදේශ නිවාඩු අනුමැතිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා නැව් සංස්ථාව සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය යන ආයතනයන් හි නිලධාරීන්ට පහත අවශ්‍යතා යටතේ අනුමැතිය ලබා දී ඇත.

| කාණ්ඩය | | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| පෞද්ගලික | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 370 |
| | ලංකා නැව් සංස්ථාව | 07 |
| | JCT පුද්ගලික සමගම | 07 |
| | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම | 07 |
| සම්මන්ත්‍රණ සහ පුහුණු | | 62 |
| රැකියා | | 13 |
| ක්‍රීඩා | | 15 |

xii.) අමාත්‍යාංශ නිළධාරීන්ගේ පුහුණු සහ වැඩමුළු

දේශීය පුහුණු

| අනු අංකය | පුහුණු වැඩමුළුවේ නම | පුහුණු වැඩමුළුව පැවැත්වූ ආයතනය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | Diploma in Public Procurement and Contract Administration | මිලෝදා පුහුණු ආයතනය | 03 |
| 02 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ අත්තිකාරම් ගිණුම් සහ විසර්ජන ගිණුම් සැකසීම පිළිබඳ දෙදින වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 02 |
| 03 | ප්‍රසම්පාදන සැලසුම් කිරීම සහ ලංසු ලියකියවිලි සකස් කිරීම | නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 04 | Diploma in Public Procurement and Contract Administration (DIPPCA) – 4th Intake | මිලෝදා පුහුණු ආයතනය | 01 |
| 05 | කාර්යාල කළමනාකරණය හා මූල්‍ය ක්‍රම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය | 02 |
| 06 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | | 01 |
| 07 | සහායක කාර්ය මණ්ඩල හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | 01 |
| 08 | ස්ථාවර වත්කම් අත්කර ගැනීම හා කළමනාකරණය | | 01 |
| 09 | භාණ්ඩ සමීක්ෂණය හා අපහරණ ක්‍රියාවලිය | | 01 |
| 10 | නිවාඩුභාර නිළධාරියාගේ කාර්යභාරය හා වගකීම | | 01 |
| 11 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ලෙස පවත්වාගෙන යාම | | 01 |
| 12 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | | 01 |
| 13 | Workshop on using Digital Signature in E-Commerce Activities | සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 01 |
| 14 | Strategies for improving Workforce Productivity in the Public Sector | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 01 |
| 15 | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා පටිපාටික රීති භාවිතය පිළිබඳ දෙදින වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 02 |
| 16 | Training of Bid Documents and Tender Procedure | මිලෝදා පුහුණු ආයතනය | 01 |
| 17 | Workshop on Public Financial Reporting | Association of Public Finance Accounts of Sri Lanka | 02 |

විදේශීය පුහුණු හා වැඩමුළු

| අනු අංකය | පුහුණු වැඩමුළුවේ නම | පුහුණු වැඩමුළුව පැවැත්වූ රට | සහභාගිවූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | Proposed Feeder Service between Colombo and Chittagong | බංගලාදේශය | 01 |
| 02 | Development of the Sustainable and Reliable Logistics System in Asian Region | ජපානය | 01 |
| 03 | International Programme on Management Auditing for the Public Sector Auditors | මැලේසියාව | 01 |
| 04 | Second Country Study Visit- Capacity Building Training Program for Class 1 (Batch 2 & 3) Officers of Sri Lanka Accountant Service | ඉන්දියාව | 01 |
| 05 | Workshop on BIMSTEC Master Plan on Transport Connectivity 17-18 September, Bangkok, Thailand | තායිලන්තය | 01 |
| 06 | Diploma in Public Procurement and Contract Administration Partial Fulfillment – 2nd Country Visit - Public Procurement Best Practice in Japan 2018 | ජපානය | 01 |
| 07 | Workshop of Line of Credit Guidelines and Procedures for the officials of the Government of Sri Lanka- EXIM bank of India | ඉන්දියාව | 01 |
| 08 | Development Administration, Moderation and Transformation Program from 11-17 November, 2018 | ඉන්දියාව | 01 |

## 1.3.2 ගිණුම් අංශය

### 1.3.2.1 කාර්ය මණ්ඩල විස්තර

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන මූල්‍ය නිළධාරී | 1 |
| ප්‍රධාන ගණකාධිකාරි | 1 |
| ගණකාධිකාරී | - |
| සංවර්ධන නිළධාරී | 5 |
| කළමනාකරණ සහකාර | 5 |
| කාර්යාල කාර්ය සහායක | 2 |

### 1.3.2.2. සිදු කළ ප්‍රධාන කාර්යයන්

- අයවැය ඇස්තමේන්තු සැකසීම.
- අක්මුදල ගිණුම සකස් කිරීම.
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මාසික අක්මුදල් සැසඳුම් වාර්තා නියමිත දිනට පිළියෙල කිරීම.
- මූල්‍ය වාර්තා සහ අත්තිකාරම් B ගිණුම පිළියෙල කිරීම.
- බැංකු කටයුතු මෙහෙයවීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම.
- පුද්ගලික පඩි නඩි, අතිකාල දීමනා සහ අනෙකුත් ගෙවීම් සිදුකිරිම.
- ප්‍රසම්පාදන රෙගුලාසි වලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.
- සැපයුම් කළමනාකරණය.
- ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම.
- භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කිරීම සහ වාර්තාව සකස් කිරීම.
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.
- මුදල් පොත පවත්වාගෙන යාම සහ දෛනිකව තුලනය කිරීම.
- විසර්ජන ගිණුම සැකසීමට අදාළ කාර්යයන් සිදු කිරීම.
- විසර්ජන වැය ලෙජරය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- වරාය ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහ රාජ්‍ය ව්‍යාපාර ගිණුම් කාරක සභාවට අදාළ කාර්යයන් සිදුකිරීම.
- විශ්‍රාම වැටුප් ගොනු ලේඛන පවත්වාගෙන යාම.
- සරප් රාජකාරි සිදුකිරීම.

# 1.3.2.3. වියදම් වාර්තාව - 2018.12.31 දිනට

වැඩසටහන 1 – මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘතිය 1 - අමාත්‍ය කාර්යාලය

| විෂය අංකය | කාණ්ඩය /විෂය | ඇස්තමේන්තුව 2018 (රු.) | මු. රෙ. 66 | සංශෝධිත ඇස්තමේන්තුව 2018 (රු.) | සමුච්චිත වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | | |
| | පුද්ගලික පඩිනඩි | | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 12,000,000.00 | 1,500,000.00 | 13,500,000.00 | 12,692040.35 | 94.02 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 4,000,000.00 | (212,000.00) | 3,788,000.00 | 3,473,449.41 | 91.70 |
| 1003 | වෙනත් දීමනා | 8,000,000.00 | (2,194000.00) | 5,806,000.00 | 4,884,141.83 | 84.12 |
| | ගමන් වියදම් | | | | | |
| 1101 | දේශීය | 1,000,000.00 | 360,000.00 | 1,360,000.00 | 1,354,326.50 | 99.58 |
| 1102 | විදේශීය | 2,000,000.00 | 3,330,000.00 | 5,330,000.00 | 5,320,492.89 | 99.82 |
| | සැපයුම් | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 2,000,000.00 | 46,000.00 | 2,046,000.00 | 2,045,213.89 | 99.96 |
| 1202 | ඉන්ධන | 7,000,000.00 | 1,100,000.00 | 8,100,000.00 | 7.654,031.68 | 94.49 |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 200,000.00 | (180,000.00) | 20,000.00 | 12,036.00 | 60.18 |
| | නඩත්තු වියදම් | | | | | |
| 1301 | වාහන | 5,000,000.00 | 225,500.00 | 5,225,500.00 | 5,225,444.62 | 100.00 |
| 1302 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 100,000.00 | (43,000.00) | 57,000.00 | 56,481.71 | 99.09 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000.00 | (100,000.00) | 0.00 | 0.00 | 0.00 |
| | සේවා | | | | | |
| 1401 | ප්‍රවාහන | 600,000.00 | 1,100,000.00 | 1,700,000.00 | 1,536,478.99 | 90.38 |
| 1402 | තැපැල සහ සන්නිවේදන | 2,000,000.00 | 204,250.00 | 2,204,250.00 | 2,204,099.56 | 99.99 |
| 1403 | විදුලිය සහ ජලය | 1,000,000.00 | (950,000.00) | 50,000.00 | 38,744.00 | 77.49 |
| 1404 | කුලී සහ බදු | 1,000,000.00 | (450,000.00) | 550,000.00 | 550,000.00 | 100.00 |
| 1408 | කල්බදු | 2,200,000.00 | (115,000.00) | 2,085,000.00 | 2,084,292.00 | 99.97 |
| 1409 | වෙනත් | 1,000,000.00 | (115,000.00) | 885,000.00 | 850,588.21 | 96.11 |
| | මාරු කිරීම් | | | | | |
| 1502 | විශ්‍රාම ප්‍රතිලාභ | 700,000.00 | (200,000.00) | 550,000.00 | 422,311.44 | 84.46 |
| | ප්‍රාග්ධන වියදම් | | | | | |
| | ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | | | | | |
| 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 200,000.00 | | 200,000.00 | 86,347.75 | 43.17 |
| 2003 | වාහන | 2,500,000.00 | 1,103.000.00 | 3,603,000.00 | 3,573,125.57 | 99.17 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් | | | | | |
| 2102 | ලීබඩු සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | 315,000.00 | 1,315,000.00 | 1,249,100.50 | 94.99 |
| 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 1,000,000.00 | (315,000.00) | 685,000.00 | 308,400.00 | 45.02 |
| | මුළු එකතුව | 54,600,000.00 | 4,409,750.00 | 59,009,750.00 | 55,613,296.90 | 94.24 |

## වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්
## ව්‍යාපෘතිය 2 - ආයතන සහ පරිපාලන සේවා

| විෂය අංකය | කාණ්ඩය/ විෂය | ඇස්තමේන්තුව 2018 (රු.) | මු. රෙ. 66 | සංශෝධිත ඇස්තමේන්තුව 2018 (රු.) | සමුච්චිත වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | | |
| | පුද්ගලික පඩිනඩි | | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 27,000,000.00 | (1,400,000.00) | 25,600,000.00 | 23,296,352.78 | 91.00 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 1,500,000.00 | 600,000.00 | 2,100,000.00 | 2,021,865.16 | 96.28 |
| 1003 | වෙනත් දීමනා | 9,500,000.00 | 860,000.00 | 10,360,000.00 | 10,328,983.44 | 99.70 |
| | ගමන් වියදම් | | | | | |
| 1101 | දේශීය | 400,000.00 | 50,000.00 | 450,000.00 | 418,510.00 | 93.00 |
| 1102 | විදේශීය | 1,200,000.00 | 275,000.00 | 1,475,000.00 | 1,432,723.09 | 97.13 |
| | සැපයුම් | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 1,500,000.00 | 430,000.00 | 1,930,000.00 | 1,832,033.21 | 94.92 |
| 1202 | ඉන්ධන | 3,000,000.00 | 1,259,000.00 | 4,259,000.00 | 4,258,822.92 | 100.00 |
| 1203 | කෑම සහ නිල ඇඳුම් | 100,000.00 | (15,000.00) | 85,000.00 | 84,150.00 | 99.00 |
| 1205 | වෙනත් | 100,000.00 | (60,0000.00) | 40,000.00 | 39,146.27 | 97.87 |
| | නඩත්තු වියදම් | | | | | |
| 1301 | වාහන | 3,600,000.00 | 0.00 | 3,600,000.00 | 3,421,234.54 | 59.03 |
| 1302 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 200,000.00 | (160,000.00) | 40,000.00 | 36,289.40 | 90.72 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.00 | | | | |
| | සේවා | | | | | |
| 1401 | ප්‍රවාහන | 1,800,000.00 | 650,000.00 | 2,450,000.00 | 2,434,023.33 | 99.35 |
| 1402 | තැපැල සහ සන්නිවේදන | 1,000,000.00 | 430,000.00 | 1,430,000.00 | 1,426,931.44 | 99.79 |
| 1403 | විදුලිය සහ ජලය | 3,500,000.00 | 100,000.00 | 3,600,000.00 | 3,600,000.00 | 100.00 |
| 1404 | කුලී සහ බදු | 8,700,000.00 | 0.00 | 8,700,000.00 | 8,654,008.20 | 99.47 |
| 1409 | වෙනත් | 3,500,000.00 | 170,000.00 | 3,670,000.00 | 3,669,078.22 | 99.97 |
| | මාරු කිරීම | | | | | |
| 1503 | රාජ්‍ය ආයතන | 25,000,000.00 | (1,500,000.00) | 23,500,000.00 | 23,500,000.00 | 100.00 |
| 1505 | දායකත්ව සහ දායක මුදල් | | | | | |
| 1506 | රාජ්‍ය සේවක දේපල ණය පොලි | 600,000.00 | 55,000.00 | 655,000.00 | 653,640.24 | 99.97 |
| 1508 | වෙනත් | 100,000.00 | 0.00 | 100,000.00 | 68,265.50 | 68.27 |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 70,000.00 | (30,000.00) | 40,000.00 | 39,810.00 | 99.53 |
| | ප්‍රාග්ධන වියදම් | | | | | |
| | ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | | | | | |
| 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 100,000.00 | 0.00 | 100,000.00 | 39,389.80 | 39.39 |
| 2003 | වාහන | 1,500,000.00 | 1,612,000.00 | 3,112,000.00 | 3,054,505.03 | 98.15 |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | | | | | |
| 2101 | වාහන | | | | | |
| 2102 | ලීබඩු සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | 0.00 | 1,000,000.00 | 996,982.76 | 99.70 |
| 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 1,000,000.00 | 0.00 | 1,000,000.00 | 154,200.00 | 15.42 |
| | කුසලතා වර්ධනය | | | | | |
| 2401 | පුහුණු හා කුසලතා වර්ධනය | 1,000,000.00 | 1,200,000.00 | 2,200,000.00 | 2,000,059.00 | 90.91 |
| | මුළු එකතුව | 96,970,000.00 | 4,526,000.00 | 101,496,000.00 | 97,501,004.33 | 96.06 |

## වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්
## ව්‍යාපෘතිය 3 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය

| විෂය අංකය | කාණ්ඩය/ විෂය | ඇස්තමේන්තුව 2018 (රු.) | මු. රෙ. 66 | සංශෝදිත ඇස්තමේන්තුව 2018 (රු.) | සමුච්චිත වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | | |
| | පුද්ගලික පඩිනඩි | | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 32,000,000.00 | | 32,000,000.00 | 19,744,578.42 | 61.70 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 650,000.00 | | 650,000.00 | 381,123.04 | 58.63 |
| 1003 | වෙනත් දීමනා | 20,000,000.00 | (2,390,000.00) | 17,610,000.00 | 17,595,077.12 | 99.92 |
| | ගමන් වියදම් | | | | | |
| 1101 | දේශීය | 500,000.00 | (400,000.00) | 100,000.00 | 97,526.00 | 97.53 |
| 1102 | විදේශීය | 1,600,000.00 | | 1,600,000.00 | 1,134,456.25 | 70.90 |
| | සැපයුම් | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 1,500,000.00 | 270,000.00 | 1,770,000.00 | 1,755,636.66 | 99.19 |
| 1202 | ඉන්ධන | 2,800,000.00 | (690,000.00) | 2,110,000.00 | 2,099,870.05 | 99.52 |
| 1203 | කෑම සහ නිල ඇඳුම් | 210,000.00 | (170,000.00) | 40,000.00 | 36,439.25 | 91.10 |
| 1205 | වෙනත් | 100,000.00 | (50,000.00) | 50,000.00 | 40,777.60 | 81.56 |
| | නඩත්තු වියදම් | | | | | |
| 1301 | වාහන | 1,000,000.00 | (270,000.00) | 730,000.00 | 670,725.34 | 91.88 |
| 1302 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 800,000.00 | (675,000.00) | 125,000.00 | 104,745.75 | 83.80 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000.00 | (50,000.00) | 50,000.00 | 20,205.00 | 40.41 |
| | සේවා | | | | | |
| 1401 | ප්‍රවාහන | 5,600,000.00 | (1,350,000.00) | 4,250,000.00 | 4,236,146.64 | 99.67 |
| 1402 | තැපැල සහ සන්නිවේදන | 800,000.00 | (150,000.00) | 650,000.00 | 565,502.32 | 87.00 |
| 1403 | විදුලිය සහ ජලය | 5,120,000.00 | 400,000.00 | 5,520,000.00 | 5,410,274.40 | 98.01 |
| 1404 | කුලී සහ බදු | 13,600,000.00 | (476,000.00) | 13,124,000.00 | 13,124,000.00 | 100.00 |
| 1409 | වෙනත් | 900,000.00 | | 900,000.00 | 879,005.50 | 97.67 |
| | මාරු කිරීම | | | | | |
| 1503 | රාජ්‍ය ආයතන | | | | | |
| 1505 | දායකත්ව සහ දායක මුදල් | 3,480,000.00 | (1,774,750.00) | 1,705,25.00 | 1,692649.25 | 99.26 |
| 1506 | රාජ්‍ය සේවක දේපල ණය පොලි | 200,000.00 | 75,000.00 | 275,00.00 | 271,834.61 | 98.85 |
| 1508 | වෙනත් | | | | | |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 50,000.00 | (35,000.00) | 15,000.00 | 14,065.00 | 93.77 |
| | ප්‍රාග්ධන වියදම් | | | | | |
| | ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | | | | | |
| 2001 | ගොඩනැගිලි | 200,000.00 | | 200,000.00 | 148,066.00 | 74.03 |
| 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 200,000.00 | | 200,000.00 | 0.00 | 0.00 |
| 2003 | වාහන | 300,000.00 | | 300,000.00 | 256,853.98 | 85.62 |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | | | | | |
| 2102 | ලීබඩු සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | | 1,000,000.00 | 180,908.48 | 18.09 |
| 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 1,000,000.00 | | 1,000,000.00 | 720,740.00 | 72.07 |
| | කුසලතා වර්ධනය | | | | | |
| 2401 | පුහුණු හා කුසලතා වර්ධනය | 3,000,000.00 | (1,200,000.00) | 1,800,000.00 | 397,941.34 | 22.11 |
| | මුළු එකතුව | 96,710,000.00 | (8,935,750.00) | 87,774,250.00 | 71,579,148.00 | 81.55 |

## 1.3.3 සැලසුම් හා සංවර්ධන අංශය

### 1.3.3.1 කාර්ය මණ්ඩල විස්තර

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක ලේකම් (සංවර්ධන) | 1 |
| අධ්‍යක්ෂ (සැලසුම්) | 1 |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 1 |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 |
| සංවර්ධන නිළධාරී | 5 |
| කළමනාකරණ සහකාර | 4 |
| කාර්යාල කාර්ය සහායක | 2 |

### 1.3.3.2 සිදු කරන ප්‍රධාන කාර්යයන්

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම - වරාය සහ නාවික ක්ෂේත්‍රයේ සංවර්ධන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා විධිමත් එකඟතාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 41ක් 2018 වසර තුළ ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කළ පත්‍රිකා 37ක් සඳහා අනුමැතිය ලැබී ඇත.
- අනෙකුත් රේඛිය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- අමාත්‍ය මණ්ඩලය විසින් සංවර්ධන ව්‍යපෘති වලට අදාළව පත් කරන ප්‍රසම්පාදන කමිටු වල කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රසම්පාදන කමිටු රැස්වීම පැවැත්වීම.
- 2017 වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් පිළියෙල කොට පාර්ලිමේන්තුව වෙත යොමුකිරීම.
- 2018 සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් ආයතනවලට ඉදිරිපත් කිරීම.
- 2018 වසර සඳහා අමාත්‍යාංශයේ කාර්යසාධනය හා 2019 වසර සඳහා අපේක්ෂිත වැඩසටහන් ඇතුළත් අයවැය කාරක සභා අවස්ථාව වෙනුවෙන් පිළියෙල කෙරෙන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු සිදුකිරීම.
- පළමුවන, දෙවන හා තෙවන කාර්තු සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- මාසික/ ත්‍රෛමාසික / වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

## 1.3.3.3 සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

විදේශ ආධාර ව්‍යාපෘතිය

| | ව්‍යාපෘතියේ නම | මූල්‍ය ප්‍රභවය | ක්‍රියාත්මක කරන ආයතනය | සංශෝධිත ඇස්තමේන්තුව (රු. මි..) | 2018.12.31 දිනට වියදම (රු. මි.) |
|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය වරාය හා නාවික කටයුතු සංවර්ධනය කිරීම | JICS- Japan | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 240.00 | - |
| 2 | කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම | Exim Bank- India | | 1,350.00 | - |
| | එකතුව | | | 1,590.00 | - |

(මෙම ව්‍යාපෘති ආරම්භක අවස්ථාවේ පවතින බැවින් ප්‍රතිපාදන පවරා ගන්නා ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇත)

ජාතික අයවැයෙන් ප්‍රතිපාදන ලබාදුන් ව්‍යාපෘති

| | ව්‍යාපෘතියේ නම | ක්‍රියාත්මක කරන ආයතනය | සංශෝධිත ඇස්තමේන්තුව (රු. මි..) | 2018.12.31 දිනට වියදම (රු. මි.) |
|---|---|---|---|---|
| 1 | කොළඹ වරායේ නැගෙනහිර බහාළුම් පර්යන්තය (ECT) සඳහා උපදේශක සේවා ලබා ගැනීම | ශ්‍රී ලංකා වරාය අධිකාරිය. | 10.00 | - |
| 2 | යාපනය අර්ධද්වීපය සහ ආශ්‍රිත දූපත් අතර මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවාව පවත්වාගෙන යාම සඳහා ජැටි පහසුකම් සංවර්ධනය | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 30.00 | 30.00 |
| 3 | නාවිකයන් සඳහා නිකුත්කරන ප්‍රවීනතා සහතික (CoC) හා අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතික (CDC), ජෛවමිතික මූලිකාංග ඇතුළත් කර නාවික හැඳුනුම්පතට අනුරූපව නිකුත් කිරීම | | 20.00 | - |
| 4 | හම්බන්තොට සහන ගිවිසුමට අදාළ කොන්දේසි සපුරාලීම | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 857.434 | 857.418 |
| 5 | හම්බන්තොට වරාය - දෙවන අදියරේ සංවර්ධන කටයුතු සඳහා පවරාගත් ඉඩම් වලට වන්දි ලබා දීම | | 219.47 | 156.215 |
| 6 | සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය | | 929.00 | 278.835 |
| | එකතුව | | 2,065.904 | 1,322.468 |

## දක්ෂිණ සංවර්ධනය අංශය

රත්නපුර, මොනරාගල සහ දකුණු පළාත් දිස්ත්‍රික්ක වල ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම අරමුණු කර ගනිමින් දක්ෂිණ සංවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇත. මෙම විෂය පථය යටතේ ප්‍රධාන වැඩසටහන් 03ක් හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇත.

- විමධ්‍යගත අයවැය වැඩසටහන
- සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන
- දක්ෂිණ සංවර්ධන වැඩසටහන

### විමධ්‍යගත අයවැය වැඩසටහන

මෙම වැඩසටහන ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදි.

| දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත මුදල රු. මිලියන | වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු. මිලියන |
|---|---|---|---|---|
| ගාල්ල | 1019 | 105.30 | 965 | 90.10 |
| මාතර | 1118 | 95.13 | 1052 | 72.73 |
| හම්බන්තොට | 538 | 70.84 | 520 | 63.40 |
| රත්නපුර | 911 | 120.00 | 890 | 106.20 |
| මොනරාගල | 615 | 59.61 | 592 | 55.28 |
| එකතුව | 4201 | 450.88 | 4019 | 387.71 |

### සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

සිංහරාජ සංරක්ෂිත පරිසර පද්ධතියට මායිම්වන තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගත් මෙම වැඩසටහන කළුතර, ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල හඳුනාගත් ව්‍යාපෘති සඳහා ක්‍රියාත්මක කරන ලදි.

| දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත මුදල රු. මිලියන | වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු. මිලියන |
|---|---|---|---|---|
| ගාල්ල | 06 | 11.50 | 06 | 10.40 |
| මාතර | 23 | 141.90 | 11 | 17.40 |
| කළුතර | 59 | 79.18 | 57 | 4.80 |
| රත්නපුර | 28 | 57.80 | 10 | 12.60 |
| එකතුව | 116 | 290.38 | 84 | 45.80 |

මෙම වැඩසටහන යටතේ කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි පිළිවෙලින් රුපියල් මිලියන 65.34ක් හා රුපියල් මිලියන 11.28ක් අතැති බිල්පත් සඳහා ගෙවීම් කළ යුතුය.

දක්ෂිණ සංවර්ධන වැඩසටහන

මේ යටතේ 2018 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 ම ආවරණය වන ලෙස රුපියල් මිලියන 603.83ක් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 729ක් අනුමත කර ඇත. ඉන් ව්‍යාපෘති 457ක් නිමකර රුපියල් මිලියන 229.8ක් ගෙවීම් කර ඇත. තවද, වැඩ අවසන් කළ රුපියල් මිලියන 102.02ක් වටිනා ව්‍යාපෘති 117ක් සඳහා ගෙවීම් කළ යුතුව ඇත.

දක්ෂිණ සංවර්ධන මණ්ඩලය සඳහා රුපියල් මිලියන 400ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2018 වර්ෂයේ රුපියල් මිලියන 26.56ක වියදමක් දරා ඇත. මේ යටතේ ව්‍යාපෘති 17කට අදාළ මූලික කටයුතු සිදුකරමින් පවතී.

## 1.3.4. විගණන අංශය

### 1.3.4.1. කාර්ය මණ්ඩල විස්තර

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 |
| සංවර්ධන නිළධාරී | 1 |
| කළමනාකරණ සහකාර | 1 |
| කාර්යාල කාර්ය සහායක | 1 |

### 1.3.4.2. සිදුකරන ලද ප්‍රධාන කාර්යයන්

- නාස්තිය සහ ඌණ උපයෝජනය වැලක්වීම අනාවරණය කර ගැනීමට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය ඇගයීම.
- වැඩ ක්‍රියාත්මක කිරීමට තුඩුදෙන ගැටළු හඳුනාගැනීම සහ ඊට පිළියම් සෙවීම.
- වත්කම් ආරක්ෂා කිරීම සහ පිරිමැස්මෙන් යුතුව භාවිතා වන්නේදැයි පරීක්ෂා කිරීම.
- වත්කම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර ඇගයීම.
- කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම
- අභ්‍යන්තර සෝදිසි සහ පාලන ක්‍රමය සාර්ථකව සැලසුම් කර ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම.
- භාවිතා කරනු ලබන ගිණුම් පිළිවෙත මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම, එහි වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම.
- ගිණුම් පටිපාටිය පිරික්සීම.
- වැඩ යෝජනා ක්‍රම සහ ව්‍යපෘති වල ප්‍රගති සමාලෝචනය.
- ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වසනීයභාවය නිශ්චය කිරීම.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, වෙනත් චක්‍රලේඛ උපදෙස් පිලිපදිනු ලැබේදැයි සොයා බැලීම.
- අවශ්‍ය අවස්ථා වල විශේෂ විමර්ශන පැවැත්වීම.

### 1.3.4.3. 2018 වර්ෂයේ සිදුකරන ලද විගණන විමසුම්

| අංකය | ඉදිරිපත්කරන ලද විගණන විමසුම් පිළිබඳ විස්තර | | |
|---|---|---|---|
| | දිනය | විෂය | ආයතනය |
| 01 | 2018.05.24 | අදායම් විගණනය | වෙළඳ නාවික ලේකම් කාර්යාලය |
| 02 | 2018.06.08 | කාර්යසාධනය පිළිබඳ විගණනය - පළමු කාර්තුව | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 03 | 2018.07.18 | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම විගණනය | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම |
| 04 | 2018.08.21 | ලිපිගොනු විගණනය | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| 05 | 2018.09.05 | අබලන් වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධ විගණනය | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 06 | 2018.09.20 | ERP පද්ධතියක් ලබාගැනීම සම්බන්ධ විගණනය | ලංකා නැව් සංස්ථාව |
| 07 | 2019.10.19 | ටෙන්ඩර ක්‍රමවේදය විගණනය | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |
| 08 | 2018.12.02 | හරිත වරායක් ලෙස නිර්මාණය කිරීමේ සාර්ථකත්වය සහ කාර්යසාධනය විගණනය | ශ්‍රී ලංකා වරාය අධිකාරිය |

### 1.3.4.4. විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ විස්තර

| රැස්වීම් වාරය | දිනය | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත වාර්තාව ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| පළමු | 2018.02.28 | 2018.03.10 |
| දෙවන | 2018.05.31 | 2018.06.11 |
| තෙවන | 2018.08.09 | 2018.08.27 |
| සිව්වන | 2018.11.29 | 2018.12.17 |

### 1.3.4.5. කාර්තුමය ප්‍රගති වාර්තාවන් විගණන සහ කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ දිනයන්

| කාර්තුව | දිනය |
|---|---|
| පළමු | 2018.04.25 |
| දෙවන | 2018.08.07 |
| තෙවන | 2018.10.30 |
| සිව්වන | 2019.01.29 |

## 1.4 අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන



# II කොටස

# වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## දැක්ම

"සාමුද්‍රික විශිෂ්ටතාවය තුළින් ජගත් නාවික කර්මාන්තයේ පිළිගැනීම"

## මෙහෙවර

"රැකියා අවස්ථා වැඩි කිරීම උදෙසා උසස් තත්ත්වයේ වෘත්තීය නැවියන් බිහි කිරීම.
ගුණාත්මක බව රකිමින් තරඟකාරී නැව් ලියාපදිංචිය පවත්වාගෙන යාම.
අදාළවන සියලු ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ රෙගුලාසි වල විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
අංශයේ නිළධාරීන්ගේ වෘත්තිමය දැනුම වර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
ඉහල මට්ටමක කාර්යක්ෂමතාවයෙන් සහ විශ්වසනීයත්වයෙන් යුතුව නියාමනය සහ සේවාභිමුඛ කාර්යයන් ඉටු කිරීම.
සාමුද්‍රික ක්‍රියාකාරකම් හා සම්බන්ධ සෑම අංශයකම අඛණ්ඩ වර්ධනයක් ඇති කිරීම."

## 2.1 මෙහෙයුම් ප්‍රගතිය

### 2.1.1 නාවිකයන් ගිවිසුම්ගත වීම

#### 2.1.1.1 ගිවිසුම්ගත නාවිකයන් (සේවයේ යෙදවීම)

සියළුම ශ්‍රී ලාංකික නාවිකයන් විසින් නෞකාවල රැකියා වල යෙදීමට හෝ පවතින නීති රෙගුලාසි වලට අනුව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේදී ගිවිසුම් අත්සන් කිරීම අත්‍යවශ්‍ය වේ.

| මාසය | නාවිකයන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 752 |
| පෙබරවාරි | 655 |
| මාර්තු | 697 |
| අප්‍රේල් | 637 |
| මැයි | 699 |
| ජූනි | 699 |
| ජූලි | 644 |
| අගෝස්තු | 659 |
| සැප්තැම්බර් | 682 |
| ඔක්තොම්බර් | 790 |
| නොවැම්බර් | 751 |
| දෙසැම්බර් | 581 |
| එකතුව | 8246 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

#### 2.1.1.2 ගිවිසුම් අවසන්කල නාවිකයන්

| මාසය | නාවිකයන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 629 |
| පෙබරවාරි | 616 |
| මාර්තු | 667 |
| අප්‍රේල් | 593 |
| මැයි | 681 |
| ජූනි | 590 |
| ජූලි | 609 |
| අගෝස්තු | 578 |
| සැප්තැම්බර් | 559 |
| ඔක්තොම්බර් | 678 |
| නොවැම්බර් | 658 |
| දෙසැම්බර් | 566 |
| එකතුව | 7424 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.1.2 සහතිකපත් නිකුත්කිරීම

### 2.1.2.1 අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව

| මාසය | අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 246 |
| පෙබරවාරි | 281 |
| මාර්තු | 226 |
| අප්‍රේල් | 196 |
| මැයි | 257 |
| ජූනි | 149 |
| ජූලි | 267 |
| අගෝස්තු | 287 |
| සැප්තැම්බර් | 184 |
| ඔක්තෝම්බර් | 239 |
| නොවැම්බර් | 205 |
| දෙසැම්බර් | 181 |
| එකතුව | 2718 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

### 2.1.2.2 ප්‍රවීණතා සහතික/මුරකාවලෙහි යෙදවීමේ සහතික සංඛ්‍යාව

නාවික අංශය

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| නැව්පති (1 වන පන්තිය) | 18 |
| නැව්පති නිළධාරී (2 වන පන්තිය) | 31 |
| නැව්පති නිළධාරී (3 වන පන්තිය) | 76 |
| ජලතරණ මුරකාවල් සහතික (නිළධාරී / නිළධාරී නොවන) | 586 |
| නිපුණතා සහතික | 306 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

ඉංජිනේරු අංශය විසින් නිකුත්කරන ලද සහතික සංඛ්‍යාව

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | 4 |
| දෙවන ඉංජිනේරු | 6 |
| තෙවන ඉංජිනේරු | 55 |
| ඉංජිනේරු මුරකාවල් සහතික (නිළධාරී / නිළධාරී නොවන) | 403 |
| නිපුණතා සහතික | 155 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.1.3 නැව් ඒජන්තවරුන් බහලුම් මෙහෙයුම් කරුවන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම - 2018

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| නැව් නියෝජිතයන් | 150 |
| බහළු මෙහෙයුම්කරුවන් | 19 |
| නැව් බඩු ගෙනයන්නන් හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් | 279 |
| යාත්‍රා බලපත්‍ර | 716 |
| නැව් සමාගම් එකතු කිරීම | 31 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.1.4 බහලුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් නිකුත් කිරීම - 2018

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| පාලම් තරාදි සඳහා (Weigh Bridge) | 35 |
| භාණ්ඩ අපනයනකරුවන් (Shipper) | 69 |
| ප්‍රයිම් මුවර් (Prime Mover) | 58 |
| ට්‍රේලර් (Trailer) | 133 |
| ලොරි රථ ( Lorry) | 09 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.1.5 ආදායම් ප්‍රකාශය 2018

වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා උපයන ලද මාසික ආදායම් පහත පරිදි වේ.

| මාසය | ආදායම (රු.) |
|---|---|
| ජනවාරි | 8,899,991.50 |
| පෙබරවාරි | 8,844,406.23 |
| මාර්තු | 7,518.438.23 |
| අප්‍රේල් | 6,263,083.58 |
| මැයි | 8,103,989.71 |
| ජූනි | 7,533,074.62 |
| ජූලි | 8,279,150.83 |
| අගෝස්තු | 7.459,328.00 |
| සැප්තැම්බර් | 8,428,331.22 |
| ඔක්තොම්බර් | 7,989,592.60 |
| නොවැම්බර් | 11,331,206.92 |
| දෙසැම්බර් | 10,386,063.52 |
| එකතුව | 101,036,656.96 |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.2 සපුරාගත් ඉලක්කයන්

### 2.2.1 මානව සම්පත් සංවර්ධනය 2018

| පුහුණුව | නිළධාරී සංඛ්‍යාව |
|---|---|
| දේශීය පුහුණු | 15 |
| විදේශීය පුහුණු | 08 |

### 2.2.2. යාපනය උප කාර්යාලයක් පිහිටුවීම

යාපනය හා දූපත් අතර ආරක්ෂිත ලෙස මඟීන් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා ජැටි පහසුකම් සංවර්ධනය

- යාපනය ප්‍රදේශයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු 90%ක් නිම කර ඇත. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී.

- යාපනය ප්‍රදේශයේ දියත්මග (Slipway) ඉදිකිරීම් කටයුතු - දියත්මග (Slipway) සඳහා නාවික හමුදාව සමඟ ඇතිකර ගෙන තිබෙන ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර මෙමෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර සම්පූර්ණ කළ යුතු අමතර ඉදිකිරීම් හා සේවකයින් බඳවා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

- දැනට යාපනය ප්‍රදේශයේ තාවකාලික කාර්යාලයක් විවෘත කර බෝට්ටු පරීක්ෂා කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

### 2.2.3. වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්

- නාවිකයන් සඳහා නිකුත්කරන ප්‍රවීණතා සහතික හා අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතික ආරක්ෂිත මූලිකාංග ඇතුළත් කර තොරතුරු තාක්ෂණය භාවිත කරමින් සහතිකපත් නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මෙම ව්‍යාපෘතියේ II අදියරේ කටයුතු ද අවසාන අදියරේ පවතී.

- ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් පවත්වන ලද විගණනය 2018.07.12 දින සාර්ථකව පවත්වා තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගෙන ඇත.

- වෙරළාසන්න කුඩා වාණිජ යාත්‍රා නියාමනය සඳහා වන රෙගුලාසි අංක 2017/31 දරණ 2017.05.04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති අතර ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය 2018.03.09 දින ලැබී ඇත.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා ජෛවමිතික හැඳුනුම්පතක් (Seafarer Identity Document) නිකුත් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇත.

## 2.3 ඉදිරි සැලසුම්

### 2.3.1 කෙටිකාලීන

- යාපනය හා දූපත් අතර ආරක්ෂිත ලෙස මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා ජැටි පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලයේ කාර්යාලීය කටයුතු හා දියත්මගෙහි (Slipway) මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

- වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු යාවත්කාලීන කර අනුමැතිය සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

- IMO සම්මුතීන් සඳහා අත්සන් කිරීම

- IMO සම්මුතීන් හි සඳහන් විධිවිධාන සඳහා දේශීය නීතිරීති සකස්කිරීම.

- නාවිකයන් සඳහා විදේශීය ධජය සහිත නෞකා වල සේවය කිරීමට අවශ්‍ය සමානතා සහතික නිකුත් කිරීම සඳහා විදේශීය රාජ්‍යයන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

- ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා ජාත්‍යන්තර පිළිගැනීමකින් යුත් ජෛවමිතික හැඳුනුම්පතක් (Seafarer Identity Document) නිකුත් කිරීම.

- ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් නිළධාරීන්ගේ ධාරිතා නැංවීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### 2.3.2. දිගුකාලීන

- වෙළඳ නාවික ලේකම් කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම

- IMO අනිවාර්යය ප්‍රඥප්තීන් හි විධිවිධානයන්ට අනුකූලව 1971 අංක 52 දරණ වෙළඳ නාවික පනත සංශෝධන සඳහා කටයුතු කර ඇත.
  එම පනත් කෙටුම්පත සඳහා ගරු නීතිපතිතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර එම පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම හා සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ ඊට අදාළ රෙගුලාසි සකස් කිරීම.

- ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් කලින් කලට පනවනු ලබන ප්‍රඥප්තීන් හා රීතීන් සමාලෝචනය කර අවශ්‍ය සම්මුතීන් අත්සන් කිරීමට කටයුතු සැලසීම.

- මෙම ප්‍රඥප්තීන් සහ රීතීන්ට අනුකූලව දේශීය නීති රීති සකස් කිරීම.

- වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු ස්වංක්‍රීයකරණය කිරීම.

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## දැක්ම

"සේද මාවතේ සමුද්‍රීය සේවා සැපයුම්
විශිෂ්ඨයා බවට පත්වීම"

## මෙහෙවර

"තිරසාර පරිසරයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ
සමුද්‍රීය සේවාවන් සැපයීම"

# 3.1 සංවර්ධන ව්‍යාපෘති

## 3.1.1 නැගෙනහිර බහළු පර්යන්තය (ECT) - කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

නැගෙනහිර බහළු පර්යන්තය - අදියර I

ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

නැගෙනහිර බහළු පර්යන්තය, දකුණු වරායේ ගැඹුරින් වැඩි දෙවැනි බහළු පර්යන්තය වන අතර, එය විස්සේ සම ඒකක මිලියන 2.4 ක වාර්ෂික මෙහෙයුම් ධාරිතාවයකින් සහ මීටර් 1200 ක් දිග ජැටි බැම්මකින් සහ මීටර් -18 ක ගැඹුරින් යුතු වේ. නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කොට මෙහෙයුම් සිදුකිරීම සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ (BOT) සහනයක් ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේවන විටත් නැගෙනහිර බහළු පර්යන්තයේ ජැටි බැම්මේ මීටර් 440 ක් ද ඊට යාබද අංගණ ප්‍රදේශය සහ ඒ හා සම්බන්ධ වෙනත් පහසුකම් ද සංවර්ධනය කර ඇත.

වර්තමාන ප්‍රගතිය

"අභිප්‍රාය ප්‍රකාශ කිරීම" (Expression Of Interest) ප්‍රසිද්ධියට පත්කිරීමත් සමඟ ව්‍යාපෘතියේ පූර්ව සුදුසුකම් ක්‍රියාවලිය 2016 ජූනි 06 වැනි දින ආරම්භ වූ අතර, 2016 සැප්තැම්බර් 20 දින අවසන් කරන ලදී. අභිප්‍රාය ප්‍රකාශ කිරීම සඳහා කැඳවීම් 2016.09.20 දින අවසන් වූ අතර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් ආසියානු සංවර්ධන බැංකුවේ සහාය සහිතව, ලැබී ඇති අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් ඇගයීමට ලක් කරන ලදී.

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් 2016.11.23 සහ 2016.12.07 යන දිනයන්හි පැවැත්වූ රැස්වීම් වලදී ව්‍යාපෘතිය සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා නව නිශ්චිත නිර්ණායකයන් අනුගමනය කල යුතු බවට උපදෙස් දෙන ලදී. සමස්ත ලංසු ක්‍රියාවලියේදී අතිරේක තෝරාගැනීමේ නිර්ණායකයන් අනුගමනය කිරීමේ සෘණාත්මක ප්‍රතිඵල පෙන්වා දෙමින් ගරු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් මෙම කරුණ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත යළි ඉදිරිපත් කිරීමට තීරණය කල අතර ලංසු ක්‍රියාවලිය 2016.12.21 දින සිට අක්‍රිය වී ඇත.

- ආසියානු සංවර්ධන බැංකුව විසින් සකස් කරන ලද අනුග්‍රාහාත්මක ගිවිසුමේ මුල් කෙටුම්පත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාලෝචනය කරන ලද අතර, ඒ පිළිබඳව වන මත ප්‍රකාශයන් ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

- කොළඹ වරායේ වැඩි ගැඹුරින් යුතු නව බහළු නෞකා නැංගුරම්පොළවල් සඳහා වන විභව අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, නැගෙනහිර බහළු පර්යන්තය - අදියර 1 හි මෙහෙයුම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ගරු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

## 3.1.2 ගාලු වරාය සංවර්ධනය

### 3.1.2.1 ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා ගාලු වරාය පුළුල් කිරීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා රජය නිරතව සිටී.

රජයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ සංචාරක කර්මාන්තය හා වාණිජ කටයුතු සඳහා ප්‍රාදේශීය වරායක් ලෙස ගාලු වරාය සංවර්ධනය කිරීම වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, දැනටමත් ඉදිකර ඇති රුවල් යාත්‍රා සඳහා පහසුකම් සැපයීමේ ප්‍රදේශය රුවල් යාත්‍රා මෙහෙයුම් කිරීම සඳහා සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

ඉහත සඳහන් ව්‍යාපෘති පෞද්ගලික අංශය හා ඒකාබද්ධව සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. මෙම යෝජනා සඳහා ඉල්ලීමේ අරමුණ වනුයේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් යෝජනාවන් ලබා ගැනීම සහ ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථානය මෙහෙයුම් කිරීම සඳහා ඒවා සැලසුම් කිරීම, ඉදි කිරීම, ආරම්භ කිරීම, මෙහෙයුම් කිරීම සහ පවරා දීමේ කටයුතු වල යෙදිය හැකි බව තහවුරු කරමින් ඒ සඳහා වන වාණිජ, කළමනාකරණ, තාක්ෂණික සහ මූල්‍ය හැකියාව පෙන්නුම් කරන විශ්වාසනීය ලංසුකරුවන් හඳුනාගැනීම වේ.

ඒ අනුව, ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා මුදල් ලබා දීම, සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මෙහෙයුම් කිරීම පෞද්ගලික අංශය විසින් සිදු කරනු ඇත. උසස් තත්ත්වයේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව රුවල් යාත්‍රා පහසුකම් ඉදිකොට, මෙහෙයුම් කොට පවරාදීම ආයෝජකයාගේ වගකීම වේ. මෙයට රුවල් යාත්‍රා සංකීර්ණයක් (Marina Concession Complex) ඇතුලත් වන අතර, ආපනශාලා, වෙළෙඳ සැල් සහ ආශ්‍රිත සේවාවන්, රුවල් යාත්‍රා සංගම් සහ විනෝදාත්මක උත්සව සහ ප්‍රවර්ධන වැඩසටහන්, ආගන්තුක සත්කාරක සේවා සහ සියළුම ආශ්‍රිත සේවාවන් ලබා දීම මගින් යාත්‍රා කිරීම හා අදාළ සියළු විනෝදාත්මක කටයුතු සඳහා ගාල්ල වරාය ආකර්ෂණීය අන්තයක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.

### 3.1.2.2 ගාලු වරායේ ක්ලොසන්බර්ග් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

අංගණය ගිලා බැසීම හේතුවෙන් පර්යන්තයන්හි මෙහෙයුම් කටයුතු අඩාලවී ඇති බැවින් ගාලු වරායේ පවත්නා ජැටිය සංවර්ධනය කිරීම සහ අළුතින් මතුපිට සකස් කිරීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත. අවශ්‍ය සැලසුම්, ප්‍රමාණ පත්‍රයන් (BOQ), ටෙන්ඩර් ලේඛන සමඟ පිරිවිතර (Specifications) සකස් කරන ලදී.

2017 ඔක්තෝබර් 31 වැනි දින පූර්ව ලංසු රැස්වීම පවත්වන ලද අතර, 2017 නොවැම්බර් 14 වැනි දින ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන ලදී. 2018 මාර්තු 22 වෙනි දින ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර වැඩබිම හෙළි පෙහෙළි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ඉදිකිරීම් කටයුතු අදියර දෙකකින් සිදු කෙරෙනු ඇත. ජැටි බැම්මේ හානි වූ ස්ථාන තුනක් පිළිසකර කරන ලද අතර අදියර 1 ප්‍රදේශයේ ඇස්පෝල්ට් ඇතිරීම අගෝස්තු මස 24 වන දින අවසන් කරන ලදී.

ව්‍යාපෘතිය 2018 නොවැම්බර් මස 19 දින වන විට සැලකිය යුතු ප්‍රමාණයකින් අවසන් කර ඇත. ඉතිරි සුළු වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. ගාල්ලේ නේවාසික කළමනාකරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට අනුව ව්‍යාපෘති - I යටතේ අතිරේක වර්ග මීටර් 575 ක ප්‍රදේශයක තාර දැමෙනු ඇත. අධ්‍යක්ෂ (තාක්ෂණික) විසින් උපදෙස් දුන් ආකාරයට ව්‍යාපෘති - I ප්‍රදේශයේ අත්හිටුවන ලද වර්ග මීටර් 585.2 ක ප්‍රදේශයේ තාර දැමීමද ඒ සමඟම සිදු වනු ඇත.

ව්‍යාපෘතිය 2018 වසරේ ඔක්තෝම්බර් 25 දින ආරම්භ කරන ලදී. අංගණයේ කැනීම් කටයුතු 75% ක් අවසන් කර ඇති අතර කොන්ක්‍රීට් දැමීම සඳහා මට්ටම් කොන්ක්‍රීට් මිශ්‍රණය (Screed Concrete) 40% ක් දමා ඇත.

3.1.2.3 ගාලු වරායේ දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම

අවි ආයුධ ඒකකය වෙනත් ස්ථානයකට ගෙන යෑම හේතුවෙන් ගාලු වරායේ ප්‍රධාන දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කර ඇත. වැඩ කටයුතු පහත සඳහන් පරිදි අදියර දෙකකින් සිදු කිරීමට සැලසුම් කර ඇත.

අදියර 1 : ප්‍රධාන දියකඩනය - 1(MB -1) ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරේ සිට මීටර 150ක් පමණ දිගට සහ (MB- 2) – SIAM City Cement සමාගමට පිටුපසින් බදු ප්‍රදේශය දිගින් මීටර 120ක් පමණ වේ
අදියර 2 : MB-3 - දියකඩනයේ දිගුව මීටර 300ක් පමණ දිගින් යුතු වේ.

සැලසුම් හා සංවර්ධන කොට්ඨාශය මගින් දියකඩනයේ නිර්මාණ කටයුතු සිදු කරන ලද අතර අදියර - I සඳහා ටෙන්ඩර් ලේඛන සකස් කරමින් පවතී.

## 3.1.3 ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය

3.1.3.1 ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු හා වර්තමාන ප්‍රගතිය

1. ත්‍රිකුණාමල වරාය සෛද්ධාන්තික ප්‍රධාන සැලැස්ම (Conceptual Master Plan) කෙටි කාලීන සහ දිගු කාලීන ව්‍යාපෘති යෝජනා මත පදනම්ව සකස්කරන ලදී. “යෝජනා සඳහා කැඳවීම්” මගින් තෝරාගෙන නිර්දේශ කරන ලද ඕෂන්පික් සහ ඩීමෝ සමාගම්හි ආයෝජන යෝජනාවන් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව (CCEM) වෙත ඉදිරිපත් කර ඇති අතර, මත්ස්‍ය වගාව සඳහා වූ යෝජනාව ලේකම්වරුන්ගේ කමිටුව (SC) විසින් අනුමත කරන ලදී.

2. ත්‍රිකුණාමලය වරායේ සිට ගල් අඟුරු සහ ක්ලින්කර් දුම්රිය මගින් ප්‍රවාහනය කිරීම ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලදී. දුම්රිය මාර්ගය හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ත්‍රිකුණාමලය දිසාපති සහ දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කරනු ලබයි. දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සමීක්ෂණයක් සිදුකරනු ලබන අතර, මෙය සිදුකිරීමෙන් අනතුරුව, අනාගත ප්‍රවේශ මාර්ගය සහ නැවත පදිංචි කිරීමේ සැලසුම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස්කරනු ඇත.

3. නව ගුදමක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, මෑතකදී කඩා ඉවත් කරන ලද කොළඹ වරායේ CFS – 2 ගුදම්හි වහල ව්‍යුහය සහ කුළුණු වෙනස්කර යළි උපයෝගී කර ගැනීමට සැලසුම් කර ඇත. ත්‍රිකුණාමලය වරායේ නව ගුදම, ගුදම් 2 සහ 3 පිහිටා ඇති ස්ථානයේම ඉදිකර ඇති අතර, එය ගල් අඟුරු, ක්ලින්කර් සහ සාමාන්‍ය නැව්බඩු තැන්පත් කිරීමට භාවිතා කරනු ඇත. එහි වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

4. පවත්නා ගුදම් අංක 6 ගරා වැටුණු තත්ත්වයේ පවතී. එමනිසා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අංක 06 දරණ ගුදම ඉවත් කර එම ස්ථානයේම මීටර 30 x මීටර 96 ක ප්‍රමාණයේ නව ගුදමක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

5. ත්‍රිකුණාමලය වරායේ ප්‍රවේශ ඇළ මාර්ගයේ වම්පස සහ දකුණුපස සඳහා ජලයේ ගිල්වා ඇති දම්වැල් භාවිතයෙන් බැඳ ඇති බෝයා ස්වයංක්‍රීයව දැල්වෙන සූර්ය ශක්තියෙන් ක්‍රියාකරන බල්බ 14 ක් සවිකිරීමට සැලසුම් කර ඇත. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රදීපාගාරය ප්‍රතිසක්‍රිය කිරීමට නියමිත ය. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ජපන් යෙන් (JPY) බිලියන 01 කි. ව්‍යාපෘතිය සිදුකෙරෙමින් පවතී.

6. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් සඳහා ඩ්‍රෝන සමීක්ෂණය (Drone Survey) ආරම්භ කර ඇති අතර 90% අවසන් කර ඇත.

3.1.3.2 ත්‍රිකුණාමල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ත්‍රිකුණාමල වරායේ තොග නැව් බඩු සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා ත්‍රිකුණාමල වරායේ පවත්නා අෂ්රෆ් ජැටිය පුළුල් කිරීමට තීරණය කර ඇත. අවශ්‍ය අනුමැතීන් කළමනාකරණ කමිටුවෙන් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබා ගෙන ඇති අතර 2018.08.07 දින ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත.

මේ වන විට අෂ්රෆ් ජැටිය පුළුල් කිරීමේ කටයුතු යටතේ පහත සඳහන් වැඩ කටයුතු කෙටි කාලීන සැලැස්මක් ලෙස සිදු කිරීමට සැලසුම් කර ඇත.

01. දැනට පවත්නා අෂ්රෆ් ජැටිය මීටර 13 සිට මීටර 14 ක සංක්‍රමණ ගැඹුරකින් යුතුව මීටර 50 කින් දීර්ඝ කිරීම. මෙමගින් දිගින් මීටර 150 ට අඩු නෞකා 2 ක් එකවර නැංගුරම් කොට මෙහෙයුම් කිරීම සඳහා මීටර 300 ක් දිග ජැටි බැම්මක් ඍජු රේඛීයව නිර්මාණය වනු ඇත.
02. පවත්නා ජැටිය සමඟ සමාන්තරව මිටර 14 ක ගැඹුරකින් යුතුව මීටර 110 ක් දිග තවත් ජැටි බැම්මක් ඍජු රේඛීයව ඉදි කිරීම. ( මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දිගු කාලීන සංකල්පය යටතේ පසුකාලීනව මීටර් 300ක් දක්වා දීර්ඝ කළ හැක.)

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික කටයුතු ලෙස, අෂ්රෆ් ජැටිය පුළුල් කිරීමේ කටයුතු සඳහා යෝජිත ප්‍රදේශයේ “මූලික බිම් විමර්ශනයන්” (Borehole investigation) සිදු කිරීමට අවශ්‍ය වේ. ඒ අනුව, මූලික බිම් විමර්ශනය සිදු කිරීම සඳහා උනන්දුවක් ඇති පාර්ශ්වයන්ගෙන් ටෙන්ඩර් කැඳවා ඇති අතර ලංසු ඇගයීමේ ක්‍රියාවලිය තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවසන් කර ඇත. තෝරාගත් ලංසුකරු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන් සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව වෙත (Minor Procurement Committee) අනුමැතිය සඳහා 2018 වසර අවසානයේදී ඉදිරිපත් කර ඇත.

3.1.3.3 ත්‍රිකුණාමලය වරායේ අෂ්රෆ් ජැටිය ප්‍රතිසංස්කරණය කිරිම

අංගණය ගිලා බැසීම හේතුවෙන් පර්යන්තවල මෙහෙයුම් කටයුතු අඩාලව ඇති බැවින් අෂ්රෆ් ජැටිය සංවර්ධනය කිරීම සහ මතුපිට අලුතින් සකස් කිරීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ටෙන්ඩර් කැඳවන ලද නමුත් කොන්ත්‍රාත්කරුගේ වරද හේතුවෙන් (පිළිනොගැනීම) තෝරාගත් අවම ටෙන්ඩරය අවසන් කරන ලද අතර ප්‍රතිශෝධිත කරුණු සහිතව ටෙන්ඩර් ලේඛනය සකස් කරමින් පවතී. වැඩ කටයුතු 2019 වසරේදී ආරම්භ කරනු ඇත. වැඩබිමෙහි තත්ත්වය සලකා බලා නව ප්‍රමාණ පත්‍රයක් සකස් කිරීමට සහ ටෙන්ඩරය යලි කැඳවීමට නියමිතව ඇත.

## 3.1.4 කන්කසන්තුරේ වරාය සංවර්ධනය

### 3.1.4.1 කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම

මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කන්කසන්තුරේ වරායේ පවත්නා පහසුකම් සමඟ අඩු ධාරිතාවයකින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. වර්තමානයේ පවතින ඉල්ලුම පිළිබඳව සැලකිල්ල යොමු කරමින්, මූලික වරාය පහසුකම් ස්ථාපිත කර පුළුල් කිරීම සඳහා කන්කසන්තුරය වරාය වාණිජ වරායක් ලෙස සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත.

2017 මැයි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 45.27 ක මූල්‍යමය ආධාර සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ එක්සිම් බැංකුව ((Exim Bank – India) සමඟ ණය ලබා ගැනීමේ ගිවිසුමකට 2018 ජනවාරි 10 දින එළඹ ඇත.

- ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රධාන කාර්යයන් ඉන්දියාවේ එක්සිම් බැංකුව මඟින් ලබාදෙනු ලබන ඩොලර් ණය යටතේ සිදු කරන අතර සැලසුම් කරන ලද සංවර්ධන කටයුතු පහත පරිදි වේ.
    - නව වාණිජ නැංගුරම්පොළක් ඉදිකිරීම (ප්‍රමාණය මීටර 167 x මීටර 22)
    - ප්‍රවේශ ඇළ මාර්ගය සකස් කිරීම සහ ද්‍රෝණිය මීටර -9 ක් දක්වා ගැඹුරු කිරීම
    - පවත්නා දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම
    - පවත්නා අංක 01 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (මීටර 50 x මීටර 6.5)
    - යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. (නාවික උපකරණ, දියකඩනයේ කොන්ක්‍රීට් මාර්ගය සහ වෙනත්)

2018.12.31 දිනට ප්‍රගතිය

- ඩොලර් ණය පිළිබඳ පූර්වගාමී කොන්දේසි සම්පූර්ණ කර ඇති අතර ණය මුදල මේ වන විට ක්‍රියාත්මකව පවතී.

- මෙම ප්‍රධාන ව්‍යාපෘති කාර්යයන් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා රජය අතර ණය දීමේ ගිවිසුම 2018 ඔක්තෝම්බර් 17 දින අත්සන් කරන ලදී.

- ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා වන පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ ලේඛනය ඉන්දියානු ආයතනයන්ගෙන් ලබාගෙන 2018 වසරේ සැප්තැම්බර් 24 වන දින ඉල්ලුම් කර ඇති අතර පූර්ව සුදුසුකම් ලත් ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරුන්ගේ ලැයිස්තුව (එක් සමාගමක් පමණි) ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත එවා ඇත.

- ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරයෙකු තෝරාගැනීම සඳහා වන ටෙන්ඩර් ලේඛනයේ ආකෘතිමය පිටපතක් (Template) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඉන්දියාවේ එක්සිම් බැංකුව (Exim Bank- India) විසින් 2018.11.23 දින එවා ඇත. ලැබී ඇති ලේඛනය තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්‍ෂා කර තවදුරටත් පරීක්‍ෂා කිරීමට සහ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

- මෙම ප්‍රධාන ව්‍යාපෘති කටයුතු සඳහා මූල්‍ය ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා පිටත වරාය ව්‍යාපෘති, සැලසුම් හා සංවර්ධන සහ මුදල් කොට්ඨාසයන්හි නිළධාරීන් ඇතුලත් කමිටුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් පත් කරන ලදී. මේවන විට ශක්‍යතා අධ්‍යයනය, කමිටුව විසින් අවසන් කර ශක්‍යතා වාර්තාව සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැති ලබාගෙන ඇත.

ඉහත සංවර්ධන කටයුතු පහසු කරනු වස්, පහත සඳහන් සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුදල් භාවිතයෙන් සිදු කෙරෙමින් පවතී.

- නව ගේට්ටු සංකීර්ණය, සීමා වැට / තාප්පය ඉදිකිරීම
- අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ වෙනත් ආයතන සඳහා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම
- මඟී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම
- අවශ්‍ය ඉඩම් පවරා ගැනීම / මිලදී ගැනීම (ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවෙන් ආරම්භයේදී අක්කර 15 ක් සහ පසුව අක්කර 35 ක් වශයෙන්)
- ජල සැපයුම සහ විදුලි සැපයුම ලබා දීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා නිවසක් මිලදී ගැනීම (පෞද්ගලික අයිතිය සහිත)

2018.12.31 දිනට ප්‍රගතිය

- කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ අවසරය මත කන්කසන්තුර වරායේ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අක්කර 50 ක භූමි ප්‍රමාණයක් පවරා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

- වරාය මෙහෙයුම් ආරක්‍ෂිතව පවත්වාගෙන යාම පිණිස, ගේට්ටු සංකීර්ණයක් සහ ගුදම් පහසුකම් සමඟ සීමා වැටක් මූලිකව අක්කර 15 ක භූමියක් වටා වැට සීමාවක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී ඇත.

- අක්කර 15 ක භූමියේ තක්සේරු වාර්තාව ලැබී ඇති අතර රුපියල් මිලියන 0.174 ක තක්සේරු පිරිවැය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇත. කෙසේ නමුත්, භූමියේ අයිතිය සිමෙන්ති සංස්ථාව විසින් මෙතෙක් තහවුරු කර නොමැති හෙයින් භූමිය අත්පත් කර ගැනීම තවමත් සිදුකර නොමැත.

- සීමා වැට / තාප්පය සහ ගේට්ටු සංකීර්ණය ඉදිකිරීම 2018 ඔක්තෝම්බර් 18 දින ආරම්භ කරන ලදී. මේ වන විට පවත්නා කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම අවසන් කර ඇති අතර මායිම්/ තාප්පය ඉදිකිරීම සඳහා අත්තිවාරම් දැමීමට කැණීම් කටයුතු ආරම්භ කර ඇත.

### 3.1.5 ජාතික වරාය ප්‍රධාන සැලැස්ම

#### 3.1.5.1 ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සහ වර්තමාන ප්‍රගතිය

ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික සහාය ලබාගෙන ඇත. ඉහත තාක්ෂණික සහාය සමඟ, ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාගැනීම වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් මිලියන 1.5ක ප්‍රදානයක් ලබාදීම මගින් වරාය ක්ෂේත්‍රයට සහාය පලකොට ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා 2016 නොවැම්බර් මස දී නෙදර්ලන්තයේ Maritime & Transport Business සමාගමේ (MTBS) සේවය මාස 18ක කාලසීමාවක් සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදී ඇත. ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ දී මෙම උපදේශකත්වයේ විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

- ජාතික වරාය ඉදිරි ගමන්මඟ (NPD)
- කොළඹ වරාය සංවර්ධන සැලැස්ම
- ත්‍රිකුණාමල වරාය සංවර්ධන සැලැස්ම
- සේවා සැපයුම් සහ වරාය ආශ්‍රිත ප්‍රදේශ එකිනෙක හා සම්බන්ධ වීම සඳහා වන ප්‍රමුඛතා ව්‍යාපෘති
- වරායට ප්‍රවේශවීම සඳහා වන ගුවන් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (Port Access Elevated Highway Project) අවසන් සැලැස්මේ තාක්ෂණික සමාලෝචනය

කොළඹ වරාය සහ ත්‍රිකුණාමලය වරායයන්ගේ පූර්ව ශක්‍යතා අදියර යටතේ අධ්‍යයනය සඳහා පහත සඳහන් කෙටිකාලීන ප්‍රමුඛතා ව්‍යාපෘතීන් 08ක් මෙම අධ්‍යයනයේ දී හඳුනාගෙන ඇත. පූර්ව ශක්‍යතා අදියරේ දී, විෂය ක්ෂේත්‍රයේ නිර්වචනය, මූල්‍යමය ශක්‍යතාවය, ආර්ථික ශක්‍යතාවය සහ සංවර්ධන ආකෘතිය ඇතුළත් වනු ඇත.

කොළඹ වරාය

1. ජය බහළු පර්යන්ත නවීකරණ සැලැස්ම
2. කොළඹ වරායේ ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු (LNG) මෙහෙයුම් කිරීම සහ ගබඩා කිරීම
3. කොළඹ වරායේ මඟීන් සඳහා වෙන්වූ පර්යන්තය
4. වරාය ප්‍රජා පද්ධතිය (Port Community System)
5. බණ්ඩාරනායක ජැටි ගුදම් ප්‍රතිස්ථානගත කිරීමේ සැලැස්ම
6. විජය කුමාර ජැටිය නවීකරණය කිරීමේ සැලැස්ම

ත්‍රිකුණාමලය වරාය

7. අෂ්රොෆ් ජැටිය නවීකරණය කිරීම - අදියර I
8. ගැඹුරු මුහුදේ තෙල් ජැටිය

පූර්ව ශක්‍යතා අධ්‍යයනයන් ඒකාබද්ධ කරමින් සියළුම අවසාන වාර්තා MTBS සමාගම විසින් ඉදිරිපත් කර ඇත.

### 3.1.6 මඟී පර්යන්ත (බණ්ඩාරනායක පාලම) ව්‍යාපෘතිය

මුහුදු සංචාරය, විනෝදාත්මක කර්මාන්ත ක්ෂේත්‍රයේ සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින වෙළෙඳපොළ අංගයකි. එය නියමු ගාස්තු, නෞකා බැඳ තැබීම වැනි වරාය කටයුතු හා ඉතා සමීපව බැඳී ඇති අතර, මඟීන් සඳහා පහසුකම් සැලසීම වරාය බලධාරීන්ගේ වගකීමක් වේ. මෙම කර්මාන්තයේ සංවිධිත වර්ධනය සඳහා මෙම පහසුකම් සැපයීම සිදු කරන නමුත් වැඩ කටයුතු දියුණු කිරීමට, පහසුකම් වර්ධනය කිරීමට සහ අනාගත සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීමට වෙනත් වෙළෙඳපොළ මෙහෙයවන්නන්ගේ සහයෝගය අවශ්‍ය වේ. මෙම පසුබිමේදී, පහසුකම් සංවර්ධනය සඳහා ආකෘතියක් ඇති කිරීමටද අදාළ සංචාරක සේවාවන් මෙහෙයවීම සඳහාද ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපකාරී වීමට, මෙම කර්තව්‍යයේදී මෙකී කර්මාන්තයේ යෙදී සිටින ක්‍රියාකාරීන් අතුරින් වර්ධන හැකියාවන් හා අනාගත සැලසුම් වලින් යුක්ත අයවලුන් හඳුනාගැනීම අවශ්‍ය වේ.

කොළඹ වරායේ මඟී පර්යන්තය සංවර්ධනය පිළිබඳව උනන්දුවක් ඇති පාර්ශ්වයන්ගෙන් අභිප්‍රාය ප්‍රකාශ කිරීම් කැඳවීම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදුකොට ඇත. යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවසන් දිනය 2018.08.01 දින වූ අතර ඇගයීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

### 3.1.7 කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීම

දකුණු වරාය සංවර්ධන කටයුතු අවසන්වීමත් සමඟ වරාය පරිශ්‍රය තුළ ඇතිවිය හැකි යැයි අපේක්ෂිත මාර්ග තදබදය ලිහිල් කිරීමට පහසුකම් සැලසීම සඳහා ඉඟුරුකඩේ හංදියේ සිට ගේට්ටු අංක 01 දක්වා දිවෙන දැනට පවතින මංතීරු 04කින් යුත් අභ්‍යන්තර වරාය මාර්ගය මංතීරු 06ක් දක්වා පුළුල් කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. මාර්ගය පුළුල් කිරීමට සමගාමීව වරාය පරිශ්‍රයේ දැනට පවතින පාලම් දෙක සහ වරාය පිවිසුම් මාර්ගයේ ඇති බිලුමැන්ඩල් මාර්ගය හරහා දිවෙන පාලම පුළුල් කිරීමද අවශ්‍ය වේ.

මංතීරු 06ක් දක්වා මාර්ගය පුළුල් කිරීම සඳහා දැනට පවත්නා ගොඩනැගිලි, කාර්යාල, වැඩහල් හා පහසුකම් සපයන ගොඩනැගිලි ආදිය කඩා දමා ඒවා වෙනත් ස්ථානයක ස්ථානගත කළ යුතුව ඇත. අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල්කිරීමේ කටයුතු 2013 වසරේ දී ආරම්භ කරන ලද අතර, ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කාර්යය සම්පූර්ණයෙන් ම අවසන්ව ඇති ප්‍රදේශයන්හි ඉදිකිරීම් කටයුතු අදියර වශයෙන් සිදුකෙරේ.

නිම නොවූ ව්‍යාපෘති

| අංකය | කාර්යය/විස්තරය | ප්‍රගතිය/පිරිවැය | සැලකිය යුතු කරුණු/ගැටළු |
|---|---|---|---|
| 01 | ටනල් ගේට් (Tunnel Gate) සහ පැරණි සේරම් ගේට්ටුව අතර මාර්ගය (චේන් 3 + 340 සිට 4 + මීටර් 020 දක්වා) | රුපියල් මිලියන 98.8ක සමස්ත පිරිවැයකට 2018 ජනවාරි මස දී ටෙන්ඩරය ප්‍රදානය කරන ලද අතර ඉදිකිරීම් වැඩ සිදු කෙරෙමින් පවතී. මේ දක්වා රු. මිලියන 50.16 ක් ගෙවා ඇත. | ඉදිකිරීම් වැඩ 88% ක් අවසන් කර ඇත.<br><br>අනපේක්ෂිත ලෙස ජල සැපයුම බිඳ වැටීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද විය. |

සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති

| අංකය | කාර්යය/විස්තරය | ප්‍රගතිය/පිරිවැය | සැලකිය යුතු කරුණු/ගැටළු |
|---|---|---|---|
| 01 | හර්තාල් පාලම සහ ශ්‍රී ලංකා නාවික සේවා මධ්‍යස්ථානය (රංගල) අතර මාර්ගය (චේන් 0 + 540 සිට 1 + මීටර් 260 දක්වා) | ඉදිරිපත්වූ ඉහළ මිල ගණන් හේතුවෙන් සියලුම ටෙන්ඩර් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. | ආරක්ෂක කොට්ඨාසය, බැංකු, වෘත්තීය සමිති ආදිය ස්ථානගත වී ඇති ගොඩනැගිලි වෙනත් ස්ථාන වල ස්ථාපිත කිරීම අවශ්‍ය කෙරේ. |

## 3.1.8 කොළඹ වරායේ අංගණ සහ පර්යන්තවල ගල් අතුරා තාර දැමීමේ කාර්යයන්

විජය කුමාර පාලම (PVQ) සහ බණ්ඩාරනායක පාලම (BQ) ගල් අතුරා තාර දැමීමේ කටයුතු

විජය කුමාර පාලමෙහි සහ බණ්ඩාරනායක ජැටි පාලමෙහි අංගණවල සෑදී ඇති වලවල් හේතුවෙන් සම්පූර්ණයෙන්ම ගිලා බැස ඇති ස්වභාවයක් පවතින හෙයින් බණ්ඩාරනායක ජැටි පාලමේ මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන අතරතුරදීම එම අංගණ වල මතුපිට සැකසීමේ කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති

| අංකය | කාර්යය/විස්තරය | ප්‍රගතිය/පිරිවැය |
|---|---|---|
| 01 | විජය කුමාර පාලමේ ගල් අතුරා තාර දැමීම - අදියර II | සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| 02 | ජය බහළු පර්යන්තය III හි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | ටෙන්ඩර් ලේඛනය සකස් කරමින් පවතී. |

## 3.1.9 බහළුගත නැව්බඩු මෙහෙයුම් මධ්‍යස්ථානයේ (CFS - II ) පිහිටා ඇති වැඩහල් වෙනත් ස්ථානයන් වෙත රැගෙන යාම

ඉඟුරුකඩේ මංසංධියේ සිට ගේට්ටු අංක 01 දක්වා වරාය පරිශ්‍රය තුළ ඉදිවන වරාය ප්‍රවේශ ගුවන් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (Port Access Elevated Project) හේතුවෙන් කාර්යාල හා වැඩබිම් ගොඩනැගිලි කිහිපයක් වෙනත් ස්ථානයන් වෙත රැගෙන යාම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව, යන්ත්‍රෝපකරණ වැඩහල් 02 ක් සහ එක් විදුලි වැඩහලක් CFS – 2 ප්‍රදේශයට රැගෙන යනු ඇත.

2018.12.12 දින දක්වා ටෙන්ඩර් ලේඛන නිකුත් කරන ලද අතර පූර්ව ලංසු රැස්වීම 2018.12.05 දින පවත්වන ලදී.

## 3.1.10 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය අදියර - II

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන්කර ව්‍යාපෘතිය භාරගෙන ඇත. ව්‍යපෘතිය නිම කළ යුතු අවසන් දිනය වන විට වැඩ කටයුතු නිම කරන ලද අතර දෝෂ නිවැරදි කිරීම සඳහා වන අතිරේක වසරක වගකීම් කාලසීමාව (Defect liability period) ක්‍රියාත්මකව පවතී. ඇතැම් සුළු ගෙවීම් සමඟ (ඇ.එ.ජ.ඩො. මිලියන 21ක් වන) රඳවුම් ගාස්තු (Retention payment) 2019 වසරේදී ගෙවීමට නියමිතය.

රජය විසින් තීරණය කළ පරිදි, 2017 ජූලි මස දී හම්බන්තොට වරාය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් මත මෙහෙයුම් කිරීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් සමාගම සමඟ අනුග්‍රාහාත්මක ගිවිසුමකට එළැඹ ඇත. 2017 දෙසැම්බර් 09 වැනි දින අනුග්‍රාහාත්මක ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහ සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගමට අයත් සියලුම වත්කම් ඉහත කී පරිපාලිත සමාගම් වෙත භාරදීමේ ක්‍රියාවලියේ දී පවරා දීමට කටයුතු කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය (රු.මිලියන) | 2018 දෙසැම්බර් අවසන් වන විට සමුච්චිත ගෙවීම් (රු. මිලියන) |
|---|---|---|
| විදේශ ණය ආධාර (FAL) | 90,923 | 76,739 |

## 3.1.11 ඔලුවිල් වෙරළ තීරයේ පාංශු විස්ථාපනය පිළිබඳ පුළුල් අධ්‍යයනය

ඔලුවිල් වරායේ උතුරු සීමාවට ඔබ්බෙන් වර්තමානයේ සිදුවන වෙරළ ඛාදනය, දකුණු සීමාවේ දකුණු දියකඩනය දිගට විශාල වශයෙන් වැලි එක්රැස්වීම, පිවිසුම් ඇළ මාර්ගය තුළ හා අවට රොන්මඩ ඉවත් කිරීම ආදී ගැටළු සඳහා පිළියම් ලෙස ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කර ඇත. මෙවැනි කාර්යයන් සඳහා ප්‍රාරම්භයක් ලෙස ඔලුවිල් වෙරළ ආශ්‍රිතව වැලි අංශු ගමන්කරන ආකාරය සහ අනාගතයේ සිදුවිය හැකි වෙනස්කම් තීරණය කිරීම සඳහා සහ පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග සැකසීම සඳහා පුළුල් ඉංජිනේරු අධ්‍යනයයක් සිදුකිරීමට යෝජනා කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා මූල්‍ය සහාය ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් සැපයීමේ නියෝජිත ආයතනය වන ඩෙන්මාර්ක් විදේශ කටයුතු අමාත්‍යාංශය (DANIDA) විසින්, දීමනා ලබාදීමේ පදනම යටතේ ලබාදීමට එකඟ වී ඇත. අධ්‍යයනය සිදුකිරිම සඳහා උපදේශන සේවාව, සාර්ථක උපදේශක සමාගමක් වන සීමාසහිත ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය වෙත වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රදානය කරන ලදී.

2017 අප්‍රේල් මස දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රැස්වීම් ශාලාවේ දී අධ්‍යයනයේ අවසන් කෙටුම්පත් වාර්තාව DANIDA ආයතනයේ නියෝජිතයන් හා අදාළ දේශීය පරදු භාරකරුවන්ගේ (Stakeholders) සහභාගිත්වයෙන් ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබාදෙන ලදී.

ඉන්පසු, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, DANIDA සහ ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනයේ සහභාගිත්වයෙන් පැවති රැස්වීමක දී, වෙනත් අඩු වියදම් විකල්ප සෙවීම සඳහා අධ්‍යයනය දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනයෙන් විෂය පථය (Scope) හා පිරිවැය යෝජනාව (Cost Proposal) ලබාගැනීම සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය අවසර ලබා දී ඇත.

2017 අප්‍රේල් මස පැවැත්වූ රැස්වීමේ දී තීරණය කළ පරිදි අධ්‍යයනය දීර්ඝ කිරීම සඳහා විෂය පථය හා පිරිවැය යෝජනාව ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය විසින් ලබාදෙන ලදී. අධ්‍යයනය පිළිබඳ අවසන් වාර්තාව 2017.06.20 වෙනි දින ඉදිරිපත් කළ අතර, අවසන් ගෙවීම ද සිදුකර ඇත.

මේ පිළිබඳව මූල්‍ය සහ තාක්‍ෂණික සහාය ලබාදෙන ලෙසට ඩෙන්මාර්ක් තානාපති කාර්යාලය වෙත ලිපියක් යවා ඇත.

2018 වසරේ ජනවාරි මස 4 වැනි සතියේ (22 සහ 23 වැනි දිනයන්හි දී) ඩෙන්මාර්කයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආයෝජන අරමුදලේ (IFU) නියෝජිතයන් හා අදාළ පරදු භාරකරුවන් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය රැස්වීම් මාලාවක් සාර්ථකව පවත්වන ලදී.

මෙම ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සහ ඔලුවිල් වරාය මෙහෙයුම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

### 3.2 මෙහෙයුම් කාර්යසාධනය සහ ජයග්‍රහණයන්

නෞකා පැමිණීම

2018 වසර තුළදී කොළඹ වරායට පැමිණි මුළු නෞකා සංඛ්‍යාව 4,331 කි. බහළු නෞකා පැමිණීම සහ බහළු මෙහෙයුම් ධාරිතාවය පිළිවෙලින් 15.1% කින් සහ 13.5% කින් ඉහළ යන ලදී.

ගෝලීය ශ්‍රේණිගත කිරීම්

- Drewry සමුද්‍රීය සමීක්ෂණය මගින් 2018 වසරේ තුන්වන කාර්තුවේදී සිදු කරන ලද ගෝලීය බහළු වරාය සම්බන්ධ කිරීමේ දර්ශකයට අනුව (Global Container Port Connectivity Index Score) කොළඹ වරාය 11 වන ස්ථානය හිමි කර ගත් අතර මෙය 2017 වසරේ ශ්‍රේණිගත කිරීමට සාපේක්ෂව ස්ථාන දෙකකින් ඉදිරියට යාමකි.

- 2018 වසර තුළදී ලොව හොඳම බහළු මෙහෙයවීමේ වරායයන් 30 අතුරින් "වඩාත්ම වේගයෙන් වර්ධනය වන වරාය" ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කර ඇත. 2018 වසරේදී කොළඹ වරාය විසින් බහළු විස්සේ සම ඒකක මිලියන 7 ක් වාර්තාගත ලෙස මෙහෙයවන ලද අතර මෙය 2017 වසරට සාපේක්ෂව 13.5% ක වර්ධනයකි. ඇල්ෆාලයිනර් (Alphaliner) ශ්‍රේණිගත කිරීමට අනුව මෙය ඉතිහාසයේ ප්‍රථම වතාවට කොළඹ වරාය අංක 1 ලෙස ශ්‍රේණිගත කළ ප්‍රථම අවස්ථාවයි.

ගෝලීය වරාය සංසදය (Global Port Forum) මඟින් ප්‍රදානය කරන ලද වසරේ හොඳම වරාය අධිකාරියට හිමි සම්මානය

ලෝක සමුද්‍රීය සිතියමේ කොළඹ වරාය ඉහළ ස්ථානයකට ගෙන ඒම සඳහා දැක්වූ විශිෂ්ට කාර්යසාධනය උදෙසා ගෝලීය වරාය සංසදය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත වසරේ හොඳම වරාය අධිකාරිය සඳහා වන සම්මානය ප්‍රදානය කරන ලදී.

අවබෝධතා ගිවිසුම 2018 - මාර්තු

කොළඹ වරායේ පර්යන්ත මෙහෙයුම්කරුවන් ත්‍රිත්වය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ජයබහළු පර්යන්තය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) විසින් සාමූහිකව කොළඹ වරාය ප්‍රවර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. තවද, නව සාමූහික ගිවිසුම යටතේ බහළු නෞකා වරායේ රැඳී සිටින කාල සීමාව (Turnaround Time) අවම කිරීමට අපේක්ෂිතය.

## 3.3 මෙහෙයුම් කාර්යය සාධනය

### 3.3.1 කොළඹ වරාය

නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| භාණ්ඩ රැගත් නෞකා | | | |
| බහළු නෞකා | 3,683 | 3,739 | 1.5 |
| සාම්ප්‍රදායික භාණ්ඩ රැගත් නෞකා | 56 | 51 | -8.9 |
| වෙනත් භාණ්ඩ රැගත් නෞකා | 436 | 395 | -9.4 |
| අළුත්වැඩියා සඳහා පැමිණි නෞකා | 58 | 50 | -13.8 |
| ඉන්ධන ලබාගැනීම සඳහා පැමිණි නෞකා | 44 | 33 | -25.0 |
| වෙනත් අවශ්‍යතා සඳහා පැමිණි නෞකා | 52 | 63 | 21.2 |
| පැමිණි මුළු නෞකා සංඛ්‍යාව | 4,329 | 4,331 | 0.0 |

බහළුගත නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| ජයබහළු පර්යන්තය සහ සමගි බහළු පර්යන්තය (JCT & UCT) | 1,352 | 1,342 | -0.7 |
| එස් ඒ ජී ටී සමාගම (SAGT) | 1,073 | 1,152 | 7.4 |
| සී අයි සී ටී සමාගම (CICT) | 1,258 | 1,245 | -1.0 |

බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| ආනයන | 689,172 | 668,402 | -3.0 |
| භාණ්ඩ සහිත | 668,226 | 648,478 | -3.0 |
| භාණ්ඩ රහිත | 20,946 | 19,924 | -4.9 |
| අපනයන | 694,379 | 674,847 | -2.8 |
| භාණ්ඩ සහිත | 277,563 | 290,223 | 4.6 |
| භාණ්ඩ රහිත | 416,816 | 384,624 | -7.7 |
| ප්‍රතිනැව්ගත කිරීම (Transshipment) | 4,741,582 | 5,602,358 | 18.2 |
| තැන්මාරු මෙහෙයුම (Re-stowing) | 83,935 | 101,879 | 21.4 |
| සමස්ත විස්සේ සම ඒකක | 6,209,068 | 7,047,486 | 13.5 |
| ප්‍රතිනැව්ගත කිරීමේ ප්‍රතිශතය (%) | 76 | 79 | |

බහළු මෙහෙයුම් ධාරිතාවය අනුව (විස්සේ සම ඒකක)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| ජයබහළු පර්යන්තය සහ සමගි බහළු පර්යන්තය (JCT & UCT) | 2,010,702 | 2,304,534 | 14.6 |
| එස් ඒ ජී ටී සමාගම (SAGT) | 1,809,835 | 2,066,758 | 14.2 |
| සී අයි සී ටී සමාගම (CICT) | 2,388,531 | 2,676,194 | 12.0 |

ගොඩබාන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත * | 42,880,553 | 47,841,066 | 11.6 |
| තොග කඩන | 813,773 | 679,390 | -16.5 |
| වියළි තොග | 2,501,363 | 2,825,454 | 13.0 |
| ද්‍රවමය තොග නැව්බඩු | 5,759,418 | 5,928,458 | 2.9 |
| එකතුව | 51,955,107 | 57,274,368 | 10.2 |

නැව් බඩු පැටවීම (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත * | 36,944,175 | 42,174,749 | 14.2 |
| තොග කඩන | 29,437 | 12,678 | -56.9 |
| වියළි තොග | 0 | 0 | - |
| ද්‍රවමය තොග නැව්බඩු | 105,822 | 689,920 | 552.0 |
| එකතුව | 37,079,434 | 42,877,347 | 15.6 |

මෙහෙය වූ සමස්ත නැව් බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත * | 79,824,728 | 90,015,815 | 12.8 |
| තොග කඩන | 843,210 | 692,068 | -17.9 |
| වියළි තොග | 2,501,363 | 2,825,454 | 13.0 |
| ද්‍රවමය තොග නැව්බඩු | 5,865,240 | 6,618,378 | 12.8 |
| එකතුව | 89,034,541 | 100,151,715 | 12.5 |

මෙහෙයුම් කරන ලද සමස්ත ටොන් ප්‍රමාණය

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| ජයබහළු පර්යන්තය සහ සමගි බහළු පර්යන්තය (JCT & UCT) | 25,791,290 | 29,080,139 | 12.8 |
| එස් ඒ ජී ටී සමාගම (SAGT) | 23,622,195 | 27,042,195 | 14.5 |
| සී අයි සී ටී සමාගම (CICT) | 30,411,243 | 33,893,481 | 11.5 |
| සී පී සී (CPC) | 4,931,877 | 5,139,674 | 4.2 |
| වෙනත් පාලම් | 4,277,936 | 4,996,226 | 16.8 |

* එස් ඒ ජී ටී සමාගම සහ සී අයි සී ටී සමාගම සඳහා තක්සේරු කළ ටොන් ප්‍රමාණය ඇතුළුව

ප්‍රධාන නැව් බඩු වර්ග අනුව ගොඩබාන ලද ප්‍රමාණය

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| දේශීය නැව් බඩු | | | |
| බහළුගත නැව් බඩු | 9,869,008 | 9,576,460 | -3.0 |
| තොග කඩන නැව් බඩු | | | |
| පොහොර | 18,972 | 30,127 | 58.8 |
| සිමෙන්ති | 0 | 197 | - |
| හාල් | 9,146 | 13,926 | 52.3 |
| සීනි | 0 | 0 | - |
| යකඩ/වානේ | 699,708 | 579,069 | -17.2 |
| දැව | 0 | 0 | - |
| වාහන | 61,892 | 37,166 | -40.0 |
| වෙනත් | 11,792 | 16,052 | 36.1 |
| වියළි තොග නැව් බඩු | | | |
| පොහොර | 34,483 | 381,666 | 1006.8 |
| සිමෙන්ති | 2,186,754 | 2,164,454 | -1.0 |
| ක්ලින්කර් | 0 | 0 | - |
| ජිප්සම් | 0 | 35,200 | - |
| තිරිඟු/බඩඉරිඟු | 280,126 | 222,134 | -20.7 |
| වෙනත් (යබොර) | 0 | 22,000 | - |
| ද්‍රවමය තොග නැව්බඩු | | | |
| බොර තෙල් | 1,595,036 | 1,766,047 | 10.7 |
| පිරිපහදු කළ තෙල් | 3,084,121 | 3,034,219 | -1.6 |
| එල් පී ගෑස් | 114,268 | 112,262 | -1.8 |
| පාම් තෙල් | 127,154 | 195,263 | 53.6 |
| කෝස්ටික් සෝඩා | 0 | 0 | - |
| සල්ෆර් සංයුතිය වැඩි නැව් ඉන්ධන | 182,972 | 83,627 | -54.3 |
| වෙනත් (දැවිතෙල්, මූලික තෙල් සහ නැව් ඉන්ධන) | 655,867 | 737,040 | 12.4 |
| ප්‍රතිනැව්ගත කිරීම් | | | |
| බහළුගත | 32,692,533 | 37,847,487 | 15.8 |
| තොග කඩන | 12,263 | 2,853 | -76.7 |
| තැන්මාරු මෙහෙයුම් | 319,012 | 417,119 | 30.8 |
| ගොඩබාන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය | 51,955,107 | 57,274,368 | 10.2 |

ප්‍රධාන නැව් බඩු වර්ග අනුව පටවන ලද ප්‍රමාණය

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| දේශීය නැව්බඩු | | | |
| බහළුගත | 4,414,289 | 4,502,985 | 2.0 |
| තොගකඩන | 7,369 | 8,742 | 18.6 |
| වියළි තොග | 0 | 0 | - |
| ද්‍රවමය තොග නැව්බඩු | | | |
| පිරිපහදු කළ තෙල් | 0 | 25,962 | - |
| නැප්තා | 0 | 64,591 | - |
| වෙරළාශ්‍රිත නැව් සේවා (රට තුළ) | 0 | 0 | - |
| නැව් සඳහා තෙල් සැපයීම | 105,792 | 599,317 | 466.5 |
| වෙනත් (තෙල්) | 30 | 50 | 66.7 |
| ප්‍රතිනැව්ගත කිරීම් | | | |
| බහළුගත | 32,192,384 | 37,238,801 | 15.7 |
| තොග කඩන | 22,068 | 3,936 | -82.2 |
| තැන්මාරු මෙහෙයුම | 337,502 | 432,963 | 28.3 |
| පටවන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය | 37,079,434 | 42,877,347 | 15.6 |

මෙහෙයුම් කරන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| මෙහෙයුම් කරන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය | 89,034,541 | 100,151,715 | 12.5 |

රෝ රෝ නැව් මගින් මෙහෙය වූ වාහන

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| පැමිණි වාහන නෞකා සංඛ්‍යාව | 73 | 31 | -57.5 |
| මෙහෙය වූ වාහන සංඛ්‍යාව | | | |
| දේශීය | 21,842 | 12,166 | -44.3 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 17,690 | 270 | -98.5 |
| එකතුව | 39,532 | 12,436 | -68.5 |

බහළු මෙහෙයුම් ධාරිතාවය - පර්යන්තය/ජැටිය අනුව (විස්සේ සම ඒකක)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | | | |
| දේශීය | 388,282 | 328,813 | -15.3 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,609,114 | 1,965,987 | 22.2 |
| තැන්මාරු මෙහෙයුම | 13,306 | 9,734 | -26.8 |
| එකතුව | 2,010,702 | 2,304,534 | 14.6 |
| සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) | | | |
| දේශීය | 375,944 | 379,939 | 1.1 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,406,265 | 1,644,336 | 16.9 |
| තැන්මාරු මෙහෙයුම | 27,626 | 42,483 | 53.8 |
| එකතුව | 1,809,835 | 2,066,758 | 14.2 |
| කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT) | | | |
| දේශීය | 619,325 | 634,497 | 2.4 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,726,203 | 1,992,035 | 15.4 |
| තැන්මාරු මෙහෙයුම | 43,003 | 49,662 | 15.5 |
| එකතුව | 2,388,531 | 2,676,194 | 12.0 |
| කොළඹ වරාය (Port of Colombo) | | | |
| දේශීය | 1,383,551 | 1,343,249 | -2.9 |
| ප්‍රතිනැව්ගත කිරීම | 4,741,582 | 5,602,358 | 18.2 |
| තැන්මාරු මෙහෙයුම | 83,935 | 101,879 | 21.4 |
| එකතුව | 6,209,068 | 7,047,486 | 13.5 |

## 3.3.2 ත්‍රිකුණාමලය වරාය

නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| භාණ්ඩ රැගත් නෞකා | 224 | 180 | -19.6 |
| අළුත්වැඩියා සඳහා පැමිණි නෞකා | 2 | 1 | -50.0 |
| ඉන්ධන ලබාගැනීමට පැමිණි නෞකා | 0 | 2 | - |
| වෙනත් නෞකා | 7 | 6 | -14.3 |
| පැමිණි මුළු නෞකා සංඛ්‍යාව | 233 | 189 | -18.9 |

ගොඩබාන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| තොගකඩන | 9,522 | 639 | -93.3 |
| වියළි තොග | | | |
| තිරිඟු තොග | 759,593 | 807,897 | 6.4 |
| ක්ලින්කර් තොග | 1,678,061 | 1,648,380 | -1.8 |
| ජිප්සම් තොග | 165,818 | 44,915 | -72.9 |
| ගල් අඟුරු තොග | 90,012 | 107,741 | 19.7 |
| සිමෙන්ති තොග | 0 | 0 | - |
| වෙනත් | 0 | 0 | - |
| ද්‍රවමය තොග (ඉන්ධන) | 416,582 | 340,986 | -18.1 |
| ගොඩබාන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය | 3,119,588 | 2,950,558 | -5.4 |

නැව් බඩු පැටවීම (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| තොගකඩන නැව් බඩු | | | |
| තිරිඟු නිවුඩු පැලට් | 121,650 | 0 | -100.0 |
| සිමෙන්ති බෑග් | 0 | 0 | - |
| වෙනත් | 0 | 0 | - |
| වියළි තොග නැව් බඩු | | | - |
| සිමෙන්ති තොග | 0 | 140,650 | - |
| වෙනත් (ක්ලින්කර්) | 618,940 | 422,855 | -31.7 |
| ද්‍රවමය තොග නැව් බඩු (ඉන්ධන) | 37,132 | 45,725 | 23.1 |
| නැව් බඩු පැටවීම් එකතුව | 777,722 | 609,230 | -21.7 |

සමස්ත නැව් බඩු මෙහෙයුම් (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| මෙහෙය වූ නැව් බඩු | 3,897,310 | 3,559,788 | -8.7 |

## 3.3.3 ගාල්ල වරාය

නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| භාණ්ඩ රැගත් නෞකා | 81 | 75 | -7.4 |
| අළුත්වැඩියා සඳහා පැමිණි නෞකා | 0 | 2 | - |
| ඉන්ධන ලබාගැනීමට පැමිණි නෞකා | 1 | 1 | 0.0 |
| වෙනත් නෞකා | 5 | 6 | 20.0 |
| පැමිණි මුළු නැව් සංඛ්‍යාව | 87 | 84 | -3.4 |

ගොඩබාන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| තොග කඩන නැව්බඩු | | | |
| පිටි (ප්‍රීමා) | 0 | 0 | - |
| සිමෙන්ති බෑග් | 0 | 0 | - |
| වෙනත් | 0 | 10 | - |
| වියළි තොග නැව්බඩු | | | |
| ක්ලින්කර් තොග | 678,029 | 686,103 | 1.2 |
| ජිප්සම් තොග | 23,830 | 36,330 | 52.5 |
| යබොර තොග | 9,557 | 6,902 | -27.8 |
| සිමෙන්ති තොග | 0 | 0 | - |
| වෙනත් | 0 | 0 | - |
| ද්‍රවමය තොග (ඉන්ධන) | | | |
| පාම් තෙල් | 0 | 0 | - |
| ඉන්ධන | 0 | 0 | - |
| වෙනත් | 0 | 0 | - |
| ගොඩබාන ලද නැව්බඩු (ටොන්) | 711,416 | 729,345 | 2.5 |
| පටවන ලද නැව්බඩු (ටොන්) | 95 | 112 | 17.9 |

මෙහෙයවන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| මෙහෙයවන ලද නැව්බඩු | 711,511 | 729,457 | 2.5 |

## 3.3.4 කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව සහ කරෙයිනගර් වරායයන්

නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| භාණ්ඩ රැගත් නෞකා | 63 | 59 | -6.3 |
| අළුත්වැඩියා සඳහා පැමිණි නෞකා | 0 | 0 | - |
| ඉන්ධන ලබාගැනීමට පැමිණි නෞකා | 0 | 0 | - |
| වෙනත් අවශ්‍යතා සඳහා පැමිණි නෞකා | 0 | 0 | - |
| පැමිණි මුළු නැව් සංඛ්‍යාව | 63 | 59 | -6.3 |

ගොඩබාන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත | 0 | 0 | - |
| තොගකඩන | 22,660 | 17,754 | -21.7 |
| වියළි තොග | 0 | 0 | - |
| ද්‍රවමය තොග | 0 | 0 | - |
| එකතුව | 22,660 | 17,754 | -21.7 |

පටවන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත | 0 | 0 | - |
| තොගකඩන | 0 | 0 | - |
| වියළි තොග | 0 | 0 | - |
| ද්‍රවමය තොග | 0 | 0 | - |
| එකතුව | 0 | 0 | - |

මෙහෙයුම් කරන ලද සමස්ත නැව්බඩු ප්‍රමාණය (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| මෙහෙයවන ලද නැව්බඩු | 22,660 | 17,754 | -21.7 |

## 3.3.5 හම්බන්තොට වරාය

නෞකා පැමිණීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| භාණ්ඩ රැගත් නෞකා | 221 | 260 | 17.6 |
| අළුත්වැඩියා සඳහා පැමිණි නෞකා | 3 | 0 | -100.0 |
| ඉන්ධන ලබාගැනීමට පැමිණි නෞකා | 0 | 0 | - |
| වෙනත් නෞකා | 6 | 10 | 66.7 |
| පැමිණි මුළු නැව් සංඛ්‍යාව | 230 | 270 | 17.4 |

ගොඩබාන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත | 0 | 343 | - |
| තොගකඩන | 155,600 | 263,668 | 69.5 |
| වියළි තොග | 0 | 75,738 | - |
| ද්‍රවමය තොග | 0 | 4,286 | - |
| එකතුව | 155,600 | 344,035 | 121.1 |

පටවන ලද නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| බහළුගත | 0 | 350 | - |
| තොගකඩන | 57,567 | 112,191 | 94.9 |
| වියළි තොග | 0 | 37,190 | - |
| ද්‍රවමය තොග | 0 | 0 | - |
| එකතුව | 57,567 | 149,731 | 160.1 |

මෙහෙයුම් කරන ලද සමස්ත නැව්බඩු (ටොන්)

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| මෙහෙය වූ නැව් බඩු | 213,167 | 493,766 | 131.6 |

රෝ රෝ නැව් මඟින් වාහන මෙහෙයුම් කිරීම

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| පැමිණි වාහන නෞකා සංඛ්‍යාව | 217 | 244 | 12.4 |
| මෙහෙයවන ලද වාහන සංඛ්‍යාව | | | |
| දේශීය | 41,188 | 85,225 | 106.9 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 66,097 | 146,430 | 121.5 |
| එකතුව | 107,285 | 231,655 | 115.9 |

## 3.3.6 සියළු වරායයන්

| විස්තරය | 2017 | 2018 | % |
|---|---|---|---|
| නෞකා සංඛ්‍යාව | 4,942 | 4,933 | -0.2 |
| ගොඩබාන ලද නැව් බඩු (ටොන්) | 55,964,371 | 61,316,060 | 9.6 |
| පටවන ලද නැව් බඩු (ටොන්) | 37,914,818 | 43,636,420 | 15.1 |
| මෙහෙයවන ලද නැව් බඩු (ටොන්) | 93,879,189 | 104,952,480 | 11.8 |

කුඩා යාත්‍රා (sailing craft), නාවික යාත්‍රා, බහුදින යාත්‍රා, බත්තල්, ටග් යාත්‍රා, විනෝද යාත්‍රා, බෝට්ටු ආදී "නැව් හැර වෙනත් යාත්‍රා" හැර පැමිණි නැව් සංඛ්‍යාව ගණනය කර ඉදිරිපත් කර ඇත.

## 3.4 මූල්‍ය කාර්යසාධනය - 2018 දෙසැම්බර් 31 දිනට

| විස්තරය | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන |
|---|---|---|
| | විගණනයට ලක් නොකළ | |
| ආදායම | | |
| මෙහෙයුම් ආදායම | 38,546.12 | 35,389.46 |
| වෙනත් ආදායම් | 13,736.75 | 8,573.54 |
| මුළු ආදායම | 52,282.87 | 43,963.00 |
| වියදම | | |
| සේවක වේතන | 15,086.80 | 12,522.90 |
| අතිකාල | 4,688.04 | 3,795.28 |
| ඉන්ධන, විදුලිය සහ වෙනත් ලිහිසි ද්‍රව්‍ය | 2,327.84 | 2,148.00 |
| වත්කම් නඩත්තු කිරීම | 1,323.44 | 1,323.70 |
| වෙනත් වියදම් (බාහිර කුලී ගාස්තු, කොන්ත්‍රාත් වැඩ, ගමන් වියදම් ආදිය ) | 6,587.25 | 8,177.81 |
| **එකතුව** | 30,013.38 | 27,967.68 |
| විදේශ ණය පොළිය සහ විදේශ විනිමය (පාඩු)/ලාභ වලට පෙර ලාභ (පාඩු) | 22,269.49 | 15,995.32 |
| විදේශ ණය පොළිය | 2,256.56 | 1,808.10 |
| විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පෙර සහ විදේශ ණය පොළියට පසු ලාභ/(පාඩු) | 20,012.94 | 14,187.22 |
| විදේශ විනිමය (පාඩු)/ලාභ | (11,316.83) | (2,193.75) |
| විදේශ විනිමය (පාඩු)/ලාභ සහ විදේශ ණය පොළියට පසු සහ බදු වලට පෙර ලාභ පාඩු | 8,696.11 | 11,993.47 |
| **විලම්බිත බදු** | (4,448.86) | 102.01 |
| විදේශ ණය පොළියට පසු සහ බදු වලට පසු ලාභ පාඩු | 4,247.25 | 12,095.48 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම නැවත ගණනය කිරීම * | (347.93) | (177.74) |
| මූල්‍ය වත්කම් විකිණීමේදී පවත්නා වටිනාකම විනාස වීම | (71.93) | 21.64 |
| ලේඛන ගත නොකළ කොටස් සඳහා වටිනාකම ලාභ/ පාඩු | (1,115.69) | - |
| වසර සඳහා වන වෙනත් සවිස්තරාත්මක මුළු ආදායම | (1,535.55) | (156.09) |
| වසර සඳහා වන සවිස්තරාත්මක මුළු ආදායම | 2,711.70 | 11,939.39 |

# සී/ස ලංකා නැව් සංස්ථාව

## දැක්ම

කලාපීය නාවික මධ්‍යස්ථානයක් ලෙස දියුණුවෙමින් පවතින ශ්‍රී ලංකාවෙහි කාර්යක්ෂම හා වඩාත් ඵලදායි ජාතික නාවික පද්ධතියක් ස්ථාපනය කිරීම හා නාවික ප්‍රවාහන සේවා පහසුකම් සංවර්ධනය කිරීම.

## මෙහෙවර

ජාතික ප්‍රවාහන සේවය වශයෙන් ශ්‍රී ලංකාවේ ආනයන, අපනයන හා දේශීය වෙරළාශ්‍රිත ප්‍රවාහන කාර්යයෙහිලා පහසුකම් සැපයීම, එයට අවශ්‍ය සහයෝගය ලබාදීම හා ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා නාවික පුහුණු අවස්ථා සපයමින් ක්ෂේත්‍රය සඳහා කාර්යක්ෂම නිළධාරීන් පිරිසක් බිහි කිරීම.

## 4.1 ප්‍රධාන අරමුණු

### 4.1.1 වෙළඳ ක්ෂේත්‍රය හා පාරිභෝගිකයන් උදෙසා

- ජාතික ආර්ථික වර්ධනයට උරදෙමින් රටෙහි ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කිරීම.
- කෙටිම කාලයක් තුළ අවම මිල ගණන් යටතේ උපරිම පාරිභෝගික විශ්වාසය රකිමින් පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

### 4.1.2 රට හා සමාජය උදෙසා

- අනාගත ජාතික සංවර්ධන ක්‍රියාවලියෙහිදී නාවික මධ්‍යස්ථානයක් වශයෙන් රටෙහි සංවර්ධනයට උරදීම.
- පාරිභෝගික අවශ්‍යතා හඳුනාගනිමින් තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආනයන ක්‍රියාවලියේදී නැව් ගාස්තු මෙරටදී ගෙවීම තුළින් (FOB Basis) විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීමට දායකවීම.
- රටෙහි තාප බල ශක්ති උත්පාදන අංශයෙහි නාවික සැපයුම් හා ප්‍රවාහන සහකරුවෙකු වශයෙන් දිගටම ක්‍රියාකිරීම.
- රටෙහි බලශක්ති/ඛණිජ තෙල් සැපයුම් කාර්යයෙහි නාවික සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම.

### 4.1.3 හිමිකාරිත්වය උදෙසා

- ලාභය උපරිම කරමින් විදේශ විනිමය රටට ඉතිරි කර ගැනීම තුළින්, රාජ්‍ය භාණ්ඩාගාරයට ඉහළම දායකත්වයක් සැපයීම.

## 4.2 ප්‍රධාන කාර්යයන්

- නැව් හිමිකාරිත්වය, නැව් කළමනාකරණය, නැව් කුලියට ගැනීම හා තැරැව් කිරීම.
- මුහුදු මාර්ගයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය.
- භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු (logistics) හා රේගු නිෂ්කාශන සේවා (අපනයන හා ආනයන).
- නැව් නියෝජිත සේවා (Agency Services).
- නාවික තැරැව්කාර සේවා (Brokering).
- නැව් කුලියට ගැනීම හා කුලියට දීම.
- පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මඟින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා නාවික පුහුණුව ලබාදීම.

## 4.3 මෙහෙයුම් කටයුතු වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

2018.01.01 දින සිට 2018.12.31 දක්වා කාලය තුළ සී/ස ලංකා නැව් සංස්ථාව විවිධාකාර කුලී කොන්දේසි මත යොදා ගත් තෙවැනි පාර්ශවීය නෞකාවන් මඟින් ගල් අඟුරු, තොග බහාලුම්, යන්ත්‍ර සූත්‍ර, වාහන වැනි නොයෙකුත් වර්ගයේ භාණ්ඩ මුහුදු මඟින් ප්‍රවාහනය කිරීමේ කටයුතු වල නිරත විය.

4.3.1 ලංකා නැව් සංස්ථාව මඟින් සිදු කරන ප්‍රධාන මෙහෙයුම්

- සී/ස ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙක සේවයෙහි යෙදවීම සහ මෙහෙයවීම.
- පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මඟින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම.
- මුහුදු මාර්ගයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීම.
- භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු හා රේගු නිෂ්කාශන සේවා (ආනයන හා අපනයන).
- නැව් නියෝජිත සේවා (Agency Services).
- සී/ස ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙක සහ තෙවන පාර්ශවීය යාත්‍රා මඟින් ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා නාවික පුහුණුව ලබාදීම.

4.3.2 ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය
(2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය සමඟ සංසන්දනාත්මකව)

| ක්‍රියාකාරකම් | ඒකක | භෞතික ප්‍රගතිය 2017 | 2018 | මූල්‍ය ප්‍රගතිය (ආදායම රු. මි.) 2017 | 2018 | මූල්‍ය විචලතාවය (%) |
|---|---|---|---|---|---|---|
| 1. ලංකා නැව් සංස්ථාවේ යාත්‍රා දෙක සේවයේ යෙදවීම | | | | | | |
| 1.1. ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම | ටොන්(මිලියන මෙ.ටො.)<br>ගමන් වාර | 0.55<br>9 | 0.49<br>8 | 1075 | 1239 | 15 |
| මෝසම් කාලය තුළ දී යාත්‍රා දෙක කුලියට දීම | ගමන් වාර | 9 | 10 | 424 | 817 | 93 |
| 2. පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මඟින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම | | | | | | |
| 2.1. ගල් අඟුරු ප්‍රවාහනයට අදාළ ඇමතුම් කොමිස් | යාත්‍රා<br>ටොන්(මිලියන මෙ. ටො.) | 24<br>1.42 | 23<br>1.39 | 107 | 169 | 59 |
| 2.2. ගල් අඟුරු ගොඩ බෑම කටයුතුවලින් ලද කොමිස් | යාත්‍රා<br>ටොන්(මිලියන මෙ. ටො.) | 33<br>2.00 | 35<br>2.11 | 419 | 274 | (35) |
| 2.3. ගල් අඟුරු යාත්‍රා රේගු නිෂ්කාෂණ(ගල් අඟුරු ප්‍රවාහනය) | යාත්‍රා | 32 | 33 | 28 | 17 | (40) |
| 3. නැව් බඩු ප්‍රවාහනය | | | | | | |
| 3.1. සම්පූර්ණ බහළුම් (TEU) තොග වශයෙන් | TEU | 2219 | 2276 | 270 | 415 | 53 |
| 3.2. බහළුමක ප්‍රමාණයට වඩා අඩුවෙන් (LCL) ප්‍රවාහනය කිරීම | F/T | 4309 | 8718 | | | |
| 3.3.රේගු නිෂ්කාෂණය නැව් බඩු යැවීම බෙදා හැරීම හා රැගෙන යාම | කාර්ය | 404 | 547 | 47 | 97 | 105 |
| 4. ඒජන්සි සේවා | | | | | | |
| 4.1. ලං.වි.ම. වග යාත්‍රා හා බත්තල් | බත්තල් | 11 | - | 11 | - | |
| 4.2 පොහොර ප්‍රවාහන යාත්‍රා | යාත්‍රා | 01 | 14 | 0.09 | 1 | |
| 4.3 ගල් අඟුරු යාත්‍රා | යාත්‍රා | 23 | 24 | 8 | 10 | |
| 4.4 අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා | යාත්‍රා | 03 | 01 | 0.2 | 0.7 | |
| මුළු නියෝජිත සේවා ආදායම | | | | 19 | 11 | (42) |
| 5. තෙවැනි පාර්ශ්වීය යාත්‍රාවල නාවික පුහුණුව | | | | | | |
| පුහුණු කළ කැඩෙට්වරු සංඛ්‍යාව | කැඩෙට්වරු සංඛ්‍යාව | 09 | 15 | 2 | 1.5 | (27) |
| මුළු ආදායම | | | | 2391 | 3041 | 27 |

මූලාශ්‍රය: මූල්‍ය කාර්ය සාධනය -කෙටුම්පත් ගිණුම්/භෞතික කාර්ය සාධනය– දෙපාර්තමේන්තුමය වාර්තා

2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවල මූල්‍ය කාර්ය සාධනය, 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය සමඟ සංසන්දනාත්මකව




මූලාශ්‍රය: මූල්‍ය කාර්ය සාධනය -කෙටුම්පත් ගිණුම්

2018 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවලින් මුළු ආදායම සඳහා දායකත්වය




මූලාශ්‍රය: මූල්‍ය කාර්ය සාධනය -කෙටුම්පත් ගිණුම්

2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

| ක්‍රියාකාරකම් | ඒකක | භෞතික ප්‍රගතිය 2018 | | මූල්‍යමය ප්‍රගතිය (ආදායම රු. මි)2018 | | මූල්‍යමය විචලතාවය (%) |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත | සත්‍ය | අපේක්ෂිත | සත්‍ය | |
| 1. ලංකා නැව් සංස්ථාවේ යාත්‍රා දෙක සේවයේ යෙදවීම | | | | | | |
| 1.1 ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම | ටොන් (මි. මෙ. ටො.)<br>ගමන් වාර | 0.61<br>10 | 0.49<br>8 | 1064 | 1239 | 16 |
| 1.2. මෝසම් කාලය තුළ දී යාත්‍රා දෙක කුලියට දීම | ගමන් වාර | 6 | 10 | 402 | 817 | 103 |
| 2. ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම | | | | | | |
| 2.1 ගල් අඟුරු ප්‍රවාහනයට අදාළ ඇමතුම් කොමිස් | ගමන් වාර<br>ටොන් (මි. මෙ. ටො.) | 25<br>1.50 | 23<br>1.39 | 116 | 169 | 46 |
| 2.2 ගල් අඟුරු ගොඩ බෑමේ කටයුතුවලින් ලද කොමිස් | ගමන් වාර<br>ටොන් (මි. මෙ.ටො.) | 35<br>2.00 | 35<br>2.11 | 254 | 274 | 8 |
| 2.3 ගල් අඟුරු යාත්‍රා රේගු නිෂ්කාෂණ | ගමන් වාර | 35 | 33 | 18 | 17 | (6) |
| 3. නැව් බඩු ප්‍රවාහනය | | | | | | |
| 3.1 සම්පූර්ණ බහාළුම් (TEU) තොග වශයෙන් | TEU | 1882 | 2276 | 284 | 415 | 46 |
| 3.2 බහාළුමක ප්‍රමාණයට වඩා අඩුවෙන් (LCL) ප්‍රවාහනය කිරීම | F/T | 4235 | 8718 | | | |
| 3.3 රේගු නිෂ්කාෂණය නැව් බඩු යැවීම බෙදා හැරීම හා රැගෙන යාම | කාර්ය | 420 | 547 | 35 | 97 | 177 |
| 4. ඒජන්සි සේවා | | | | | | |
| 4.1පොහොර | යාත්‍රා | 02 | 14 | 0.1 | 1 | |
| 4.2 ගල් අඟුරු යාත්‍රා | යාත්‍රා | 25 | 24 | 8 | 10 | |
| 4.3 අනෙකුත් නැව් බඩු ප්‍රවාහනය | යාත්‍රා | 04 | 01 | 0.6 | 0.7 | |
| මුළු ඒජන්සි සේවා ආදායම | | | | 9 | 11 | 26 |
| 5. තෙවැනි පාර්ශවීය යාත්‍රාවල නාවික පුහුණුව | | | | | | |
| පුහුණු කළ කැඩෙට්වරු සංඛ්‍යාව | කැඩෙට්වරු සංඛ්‍යාව | 50 | 15 | 10 | 1.5 | (50) |
| මුළු ආදායම | | | | 2192 | 3041 | 39 |

මූලාශ්‍රය: අපේක්ෂිත ඉලක්ක – ක්‍රියාකාරී සැලසුම 2018, සත්‍ය මූල්‍ය ප්‍රගතිය -කෙටුම්පත් ගිණුම්

2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවල මූල්‍ය කාර්ය සාධනය




මූලාශ්‍රය: අපේක්ෂිත ඉලක්ක – ක්‍රියාකාරී සැලසුම 2018, කෙටුම්පත් ගිණුම්

මූලික සටහන්;

1. පෙර වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය තුළ සී/ස ලංකා නැව් සංස්ථාවේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාරික කටයුතුවල ආදායම 27% කින් වැඩි වී ඇත.
2. 2018 වර්ෂය තුළ සී/ස ලංකා නැව් සංස්ථාවේ යාත්‍රා 02 මඟින් උපයන ලද ආදායම මුළු ආදායමෙන් 68% කි.
3. ගල් අඟුරු ගොඩබෑමේ කටයුතු වලින් ලද කොමිස් ආදායමෙන් 50% ක් ලංකා විදුලිබල මණ්ඩලයත් සමඟ සමව භුවමාරු කර ගැනීම හේතුවෙන් 2017 වසරට සාපේක්ෂව 2018 හි එම ආදායම පහත වැටී ඇත.
4. ගල් අඟුරු ප්‍රවාහනය කළ ප්‍රමාණය හා ඒ තුළින් ලද ආදායම තරමක පහත වැටීමක් පෙන්වීමට හේතු වී ඇත්තේ පෙර සෘතුව තුළ ලංකා විදුලි බල මණ්ඩලය සතුව ගල් අඟුරු තොග ඉතිරිව පැවතීමයි.
5. බත්තල් වල හිමිකාරිත්වය 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාවට භාර දීම හේතුවෙන් එහි ආදායම අහිමි වී ඇත.
6. 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් දුම්රිය යන්ත්‍ර හා මැදිරි ආනයනය කිරීම නිසා අනෙකුත් නැව් බඩු ප්‍රවාහනය තුළින් ලබන ආදායම වැඩි වී ඇත.
7. තෙවන පාර්ශ්වීය යාත්‍රාවල තිබෙන පුහුණු අවස්ථාවන් අනුව පුහුණු කෙරෙන කැඩෙට් නිලධාරීන් සංඛ්‍යාව වෙනස් වීමට බලපානු ලබයි.
8. මූල්‍ය ප්‍රගතිය, 2016/17, 2017/18 සහ 2018/19 මූල්‍ය වර්ෂයන් සඳහා පිළියෙල කළ කෙටුම්පත් ගිණුම් තුළින් වාර්තා කර ඇත.
9. ගණුදෙණුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වල ආදායම් හඳුනාගැනීමේ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 ට අනුකූලව (IFRS 15) මූල්‍ය ප්‍රගතිය වාර්තා කර ඇත.

## 4.4 ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙකේ නාවික පුහුණුව

2018.12.31 දින වන විට නැව් දෙකෙහිම පුහුණුව ලබමින් සිටි ආධුනික නිළධාරීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| යාත්‍රාව | පුහුණුව ලද කැඩෙට්වරු සංඛ්‍යාව |
|---|---|
| සිලෝන් ප්‍රින්සස් | 14 |
| සිලෝන් බ්‍රීස් | 17 |

ආරම්භයේ සිට 2018.12.31දක්වා කාලය තුළ නැව් දෙකෙහි පුහුණුව ලැබූ මුළු ආධුනික නිළධාරීන් සංඛ්‍යාව

| යාත්‍රාව | නාවික | එන්ජින්යාන්ත්‍රික | විදුලි යාන්ත්‍රික | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සිලෝන් ප්‍රින්සස් | 52 | 14 | 05 | 71 |
| සිලෝන් බ්‍රීස් | 48 | 21 | 04 | 73 |
| මුළු සංඛ්‍යාව | 100 | 35 | 09 | 144 |

මූලාශ්‍රය: සී/ස ලංකා නැව් සංස්ථාවේ තාක්ෂණ අංශය

2018 වර්ෂය සඳහා ලංකා නැව් සංස්ථාව සතු නැව්වල කැඩෙට්වරු පුහුණු කිරීම සඳහාවූ සමස්ත වියදම ආසන්න වශයෙන් රුපියල් මිලියන 24 කි.

## 4.5 2018.04.01 සිට 2018.12.31 දක්වා කාලපරිච්ඡේදය තුළ සී/ස ලංකා නැව් සංස්ථාවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

සී/ස ලංකා නැව් සංස්ථාව සංස්ථාපිත සමාගමක් ලෙස, 2007 වසරේ සමාගම් පනතට අනුව, මාර්තු 31 වන දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් සකස්කරයි. ඒ අනුව සමස්ථ මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

2018.04.01 සිට 2018.12.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ලාභ - අලාභ ප්‍රකාශය

| | රු. |
|---|---|
| ආදායම (සටහන 02) | 1,934,931,731 |
| සෘජු මෙහෙයුම් වියදම් | (1,202,957,536) |
| දළ ලාභය | 731,974,195 |
| වෙනත් ආදායම් | 56,415,471 |
| කළමනාකරණ වියදම්(සටහන 03) | (166,375,570) |
| මෙහෙයුම් ලාභය | 622,014,096 |
| මූල්‍ය වියදම් (මහජන බැංකුවේ ණය සඳහා පොළිය) (සටහන 04) | (691,194,343) |
| ලාභය/(පාඩුව) බද්දට පෙර | (69,180,247) |

මූලාශ්‍රය:කෙටුම්පත් ගිණුම්

සටහන 01:

*කෙටුම්පත් ගිණුම් පදනම්ව ඇත.

*2018.04.01 සිට 2018.12.31 කාලපරිච්ඡේදය සඳහා විනිමය පාඩු ගණනය නොකරන ලදී.

සටහන 02: 2018.04.01 සිට 2018.12.31 දක්වා මුළු ආදායම

| | රු. |
|---|---|
| 1. යාත්‍රා දෙකෙන් ලැබෙන මෙහෙයුම් ආදායම | 1,396,735,891 |
| 2. ගල් අඟුරු ප්‍රවාහනයෙන් ලැබෙන ආදායම | 209,895,046 |
| 3. පුත්තලම වරායේ රේගු නියෝජිත සේවා | 7,500,000 |
| 4. පුත්තලම වරායේ නැව් නියෝජිත සේවා වලින් ලැබෙන ආදායම | 3,892,609 |
| 5. කොළඹ වරායේ නැව් නියෝජිත සේවා වලින් ලැබෙන ආදායම | 1,235,479 |
| 6. NVOCC ආදායම | 292,891,069 |
| 7. නිෂ්කාෂණ හා ඉදිරිපත් කිරීමේ ආදායම( Clearing & Forwarding) | 21,604,193 |
| 8. තෙවන පාර්ශ්වීය යාත්‍රා මඟින් නාවිකයින් පුහුණු කිරීම තුළින් ලබන ආදායම | 1,177,444 |
| මුළු ආදායම | 1,934,931,731 |

සටහන 03: 2018.04.01 සිට 2018.12.31 දක්වා කාලපරිච්ඡේදය සඳහා කළමනාකරණ වියදම්

| | රු. |
|---|---|
| 1. සේවකයන් වෙනුවෙන් දරණ ලද වියදම් | 114,317,770 |
| 2. පරිපාලන වියදම් | 28,431,931 |
| 3. ප්‍රචාරක කටයුතු | 1,111,178 |
| 4. සංචාරක සහ යැපීම් | 8,320,513 |
| 5. වෘත්තීය ගාස්තු සහ නීති ගාස්තු | 2,235,630 |
| 6. සන්නිවේදනය | 4,290,025 |
| 7. පොදු වියදම් | 859,688 |
| 8. ක්ෂය වීම් | 4,250,000 |
| 9. බැංකු ගාස්තු | 2,558,835 |
| මුළු කළමනාකරණ වියදම් | 166,375,570 |

සටහන :04

| මූල්‍ය වියදම් - | රු. |
|---|---|
| පොළී වියදම් – යාත්‍රා සඳහා ණය | 691,194,343 |




මූලාශ්‍රය: කෙටුම්පත් ගිණුම් 2018/19

## 4.6 2018 වර්ෂයේ යෝජිත නව ව්‍යාපාර/ ව්‍යාපෘතිවල ප්‍රගතිය

(අමාත්‍යාංශයේ අනුමැතියට හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව)

| ව්‍යාපෘති | තත්ත්වය | ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| 1. කොළඹ වරාය හා විතගොං වරාය අතර බහාලුම් නැව් පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම | අභිප්‍රායික ලිපි (EOI) හා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. | කැබිනට් අනුමැති සාකච්ඡා කමිටුවේ (CANC) අනුමැතිය ලැබීමෙන් පසු අභිප්‍රායික ලිපි (EOI) කැඳවීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම.<br><br>2019 මාර්තු මාසයේදී ස්ථාවර මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) ලංකා නැව් සංස්ථාව (CSC) සහ බංග්ලාදේශ නැව් සංස්ථාව (BSC) විසින් අත්සන් කිරීමට නියමිතව ඇත. |
| 2.කොළඹ/තුත්තුකුඩි/කොළඹ අතර මගී ප්‍රවාහන යාත්‍රා සේවයක් ආරම්භ කිරීම | අභිප්‍රායික ලිපි (EOI) කැඳවූ අතර පාර්ශවයන් හතරක් ප්‍රතිචාර දැක්වූහ. | යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීම සඳහා කැබිනට් අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියි. |
| 3. ලොව පුරා ව්‍යාප්ත නැව් හිමියන් සඳහා ශ්‍රී ලංකා ධජය ප්‍රවර්ධනය කිරීම | යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. | යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ස්ථාවර කැබිනට් පත්වීම් ප්‍රසම්පාදන කමිටුව (SCAPC) වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශේෂඥ කමිටුව විසින් පවත්නා රෙගුලාසි වෙනස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට නියමිතය. |
| 4. අර්ධ පූර්ණ බහාලු (LCL), බහුවිධ රටවල් ඒකාබද්ධව ක්‍රියාත්මක කරන බහලුම් මෙහෙයුම් (MCC) සහ සහගාමී නොවන පෞද්ගලික ගමන් මළු නිෂ්කාශන ගුදම් (UPB) මෙහෙයුම් කටයුතු සඳහා රේගු බන්ධන ගබඩාවක් පිහිටුවීම. | යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. | යෝජනා සඳහා ඉල්ලීම් (RFP) සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීමට නියමිතය.<br><br>ව්‍යාපෘති කමිටුව සඳහා අතිරේක සාමාජිකයින් 2ක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙන් (ICTAD) සහ ආයෝජන මණ්ඩලයෙන් (BOI) අමතර සාමාජිකයන් පත් කිරීමට නියමිතව ඇත. |